# 2022 නොවැම්බර් මස 09 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති

# මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.11.09 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 13. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 23. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන

නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 ඔක්තෝබර් මස 18 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි,පසුගිය සභා වාර්තාවේ පිටු අංක 12හි සඳහන් මාගේ ප්‍රකාශයෙන් මා අදහස් කළේ විගුලුවත්ත මාර්ගයේ කාණුව සඳහා ආවරණයක් සාදා ගැනීම සම්බන්ධව ගම්පොළ නගර සභාවෙන් ඉල්ලීමක් සිදුකරන ලෙසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 21හි සඳහන් පාන් රාත්තලක බර ග්‍රෑම් 450ක් වශයෙන් සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය

ගරු සභාපතිතුමනි,මා විසින් පසුගිය සභාවේදී කළ ප්‍රකාශය සඳහන් වී නැහැ.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමිය ,සභා වාර්තාව සංක්ෂිප්ත වාර්තාවක් ලෙස සකසන බැවින් සම්පූර්ණ කථාවම ඇතුළත්ව නැහැ.වෙනත් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.10.18 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.10.18 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මගින් පළාත් පාලන සභිකවරියන් සඳහා මැතිවරණ ප්‍රචාරණය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් සංවිධානය කර ඇති බව දන්වමින් එම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

02.රට තුළ නිර්මාණය වෙමින් පවතින ආහාර අර්බුදයට විසඳුමක් ලෙස දුම්රිය රක්ෂිත ඉඩම් පරිහරණය වෙනුවෙන් අය කරනු ලබන බදු මුදල පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය සමඟ පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කළ ලිපිය සභා ගත කරමි.

03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය

ගඟ ඉහළ කෝරළය ග්‍රාම සේවා වසම් 31කින් සමන්විත වර්ග කිලෝමීටර් 103.76 ක වපසරියකින් යුත් ප්‍රාදේශීය සභාවකි. තව ද මැතිවරණ කොට්ඨාශ 13 කින් සමන්විත වන අතර, සිංහල , දමිළ , මුස්ලිම් හා වෙනත් ජන කොටස් නියෝජනය කරමින් 2018 මාර්තු මස 29 වන දින ගරු සභිකයින් 23කින් යුත් නව සභාවක් පත්වුණි.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම යටතේ හා ගම සමග පිළිසඳර උපයෝගී කරගෙන මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන සියලුම ජනතාවගේ දිළිඳු බව අවම කිරීමත් , ඔවුන්ගේ යටිතල පහසුකම් වැඩි දියුණු කර තෘප්තිමත් ජනතාවක් බිහිකිරීම මෙහි ප්‍රධාන පරමාර්ථ වේ. මෙම කාර්යයන් ඉටුකිරීම සඳහා අප සභාව සතුව ඇති සීමිත සම්පත් උපයෝගී කරගෙන එම සම්පත් නිසි අයුරින් කළමනාකරණය කර මෙම කාර්යය කිරීම මාගේ ප්‍රධානතම වගකීමකි. ඒ අනුව 2023 වර්ෂයේ අයවැය ලේඛනය නිවැරදිව සකස් කර ඉදිරිපත් කරන බව මම ඉමහත් සතුටින් ප්‍රකාශ කර සිටිමි.

මෙම අයවැය ලේඛනයේ තිරසාර සංවර්ධනය කරා යන ගමනේදී සභාව කාර්ය සාධන දර්ශක 05ක් කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇති අතර, එම දර්ශක පහත පරිදි සඳහන් කරමි.(KPI)

01. වාර්ෂිකව ජනනය වන කසළ ප්‍රමාණය 1.5% කින් අඩුකර ගැනීම.

02. වාර්ෂිකව සංවර්ධනය කරන මාර්ගවල දුර ප්‍රමාණය 1% කින් වැඩි කිරීම.

03. ඵලදායිතා හා කාර්ය සාධන ඇගයීම් සංඛ්‍යාව වැඩිකර ගැනීම. (දිස්ත්‍රික්/පළාත්/ජාතික මට්ටමින්)

04. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ නව ස්වයං උත්පාදනය 1%කින් වැඩිකර ගැනීම.

05. වාර්ෂිකව නව මෙවලම් භාවිතය වැඩි කර ගැනීම.

2023 වර්ෂය තුලදී ද මෙම ඉලක්ක සපුරාලීමට අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබෙන බවත් , මේ සඳහා එම කාර්යයන් ඉටුකරගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට කටයුතු කරන බව ප්‍රකාශ කර සිටිමි.

තවද සභාවේ දැක්ම සහ මෙහෙවරට අනුකූලව ක්‍රියාකාරකම් හඳුනාගෙන එයට ගැළපෙන ආකාරයෙන් අයවැය ලේඛනය සකස් කළ යුතු වේ.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක:168,169 සහ 170 වගන්ති කෙරෙහි අවධානය යොමු කර 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස් කර ඇති බව විශේෂයෙන් සඳහන් කරමි.තවද අයවැය ලේඛනය සැකසීම නීතිරීතිවලට අනුකූලව කළයුතු කාර්යයක් වේ. ඒ අනුව 2023 වර්ෂයේ අයවැය ලේඛනයේ පහත ආදායම් හා වියදම් ශීර්ෂ කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීමට අදහස් කර ඇත. එම විස්තර පහත පරිදි වේ.

පුනරාවර්තන ආදායම්

10 - වරිපනම් හා බදු

20 - කුලී

30 - බලපත්‍ර ගාස්තු

40 - සේවා සඳහා ගාස්තු

50 - වරෙන්තු ගාස්තු හා දඩ මුදල්

60 - වෙනත් ආදායම්

70 - ආදායම් ආධාර

පුනරාවර්තන වියදම්

01 - වැටුප් හා දීමනා

02 - ගමන් වියදම්

03 - සැපයුම් හා උපකරණ

04 - ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව

05 - ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා

06 - පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල්

07 - ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර

08 - විශ්‍රාම වැටුප්/විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික

2023 අයවැය ලේඛනයෙන් පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- සාමාන්‍ය පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා
- සෞඛ්‍ය සේවා
- භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි
- ජල සේවා
- වෙනත් මහජන උපයෝගිතා සේවා
- සුභසාධන සේවා

ගඟ ඉහළ කෝරළේ ජනතාවට වඩාත් ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම තුළින් ආයතනයේ දැක්ම කරා මෙහෙයවීම ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රථම පුරවැසියා ලෙස මාගේ ඒකායන බලාපොරොත්තුවයි. එමෙන්ම 1987 අංක 15 දරණ ප්‍රදේශීය සභා පනතට අනුව සහ 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති යටතේ 02 වන පරිච්ඡේදයේ 11 වන ඡේදය අනුව නිසි වේලාවට අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම සභාවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් මාගේ පරම යුතුකම බවද මෙහි සඳහන් කරමි. ඒ අනුව ඉහත අපෙක්ෂාවන් සාක්ෂාත් කරගැනීමට 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සකස් කරන ලද අයවැය මා හට විශාල රුකුලක් වේ යැයි මාගේ විශ්වාසයයි.

තව ද 2023 අයවැය ලේඛනය සැකසීමේ දී අයවැය මූලධර්ම කෙරෙහි ද අවධානය යොමු කර පසුගිය වසර කිහිපයක සත්‍ය ආදායම් හා වියදම් පිළිබඳව සැලකිල්ලට ගෙන ආදායම් වියදම් වෙළඳපොල මිල උච්ඡාවචනය කෙරෙහිද සැලකිල්ලක් යොමු කර ඇත.

මෙම අයවැය ලේඛනයේ විශේෂ කරුණු රාශියකට ද අවධානය යොමු කිරීමට සිදු විය. සභා අරමුදල් හා වෙනත් රාජ්‍ය මූලාශ්‍රයාධාර යටතේ ලැබෙන ප්‍රතිපාදන කෙටිකාලීන සැලසුමකට ඇතුළත් කිරීමටත්, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කිරීමටත් සැලසුම් කර ඇත.

එසේම ඇස්තමේන්තුගත ආදායම සහ එකී එක් එක් අය විෂයන් මත වර්ෂයේ එක් එක් මාසයේ අය කර ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය කොතෙක් ද යන වග පුරෝකථනය කිරීම වර්ෂය ආරම්භයේ සිදුකිරීමටත්, එක් එක් අය විෂය සම්බන්ධයෙන් කරන ලද ඇස්තමේන්තුව අදාළ මාසය තුළ හා ඒ මාසය අවසානය වන විට සම්පූර්ණයෙන් ලැබිය යුතු බවට පුරෝකථනය කරන ලද මුදල් ප්‍රමාණය අදාළ මාසය තුළ එකතු කරන ලද මුදල් ප්‍රමාණය හා අදාළ මාසය අවසානයේ දී ලැබිය යුතු සම්පූර්ණ මුදල ඉක්මවා හෝ ඊට අඩු වූ මුදල් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ද සකස් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව අයවැය ඉලක්ක කර ආදායම් අයකර ගැනීමට බලාපොරොත්තු වේ.

එමගින් තවදුරටත් ඇස්තමේන්තුගත වියදම් හා එකී එක් එක් වැය විෂයන් මත වර්ෂයේ එක් එක් මාසය තුළ සිදු කිරීමට යෝජිත කාර්යයන් හා වැය කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය කොතෙක් ද යන්න පිළිබඳ පුරෝකථනය කිරීමටත් සෑම වැය විෂයයකට ම අදාළ ව ඇති කරගෙන තිබෙන ප්‍රතිපත්ති ප්‍රමාණය හා එක් එක් වැය විෂයයන් දරන ලද වැය ප්‍රමාණය හා එකී එක් එක් ගෙවීමෙන් අනතුරුව වැය විෂයයන්වල ඉතිරි ප්‍රතිපාදනයන් පෙන්නුම් කරන අයවැය ලේඛනයක් කිරීමට ද 2023 වර්ෂයේ සැලසුම් කර ඇති අතර එය මුදල් කමිටුව මගින් සාකච්ඡා කිරීමට ද අදහස් කරමි.

තව ද මෙම අයවැය ලේඛනයේ විශේෂත්වය වන්නේ සෑම අය විෂයයක් වෙනුවෙන් ම සකස් කරන ආදායම් ඇස්තමේන්තු පවතින මූලික නීතිය හා අතුරු ව්‍යවස්ථාවලට අනුකූල ව තිබීම හා ව්‍යවස්ථාපිත බැඳීම් හා ගිවිසුම්ගත බැඳීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට පියවර ගෙන තිබීමයි. දිගු කාලීන සංවර්ධන සැලැස්මට අදාළ වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සලකා නිශ්චිත වශයෙන් අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන් කර ඇති බව සඳහන් කරමි.

මෙම අයවැය ලේඛනයේ කාර්ය සාධනය, ඵලදායිතාවය හා අනෙකුත් කාර්යයන් සඳහා සභාවේ මූල්‍ය තත්ත්වය අනුව ප්‍රතිපාදන වෙන් කර ඇත. එමෙන් ම මෙම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් හා ඔවුනගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සභාවේ මූලික පරමාර්ථය වන හෙයින් අපි සියලු දෙනාම එක් ව මෙම අවශ්‍යතාවයන් ඉටු කිරීමට කටයුතු කරමු.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනයට ඇතුළත් කරන ලද තොරතුරු පිළිබඳ විග්‍රහය

**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168, 169, 170 වගන්ති ප්‍රකාරව සෑම ප්‍රාදේශීය සභාවකම සභාපතිවරයා විසින් ඊළඟ වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කොට නීතියේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. මේ පිළිබඳ ව පළාත් පාලන විශේෂ විධිවිධාන පනත කෙරෙහි ද අවධානය යොමු කර අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වේ.එම අයවැය ලේඛනය අදාළ වර්ෂය ආරම්භ වීමට පෙර සෑම ප්‍රාදේශීය සභාවක් විසින්ම සංශෝධන ඇතිව හෝ නැතිව සභා සම්මත කළ යුතු වන්නේය.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 129 සහ 132 වන වගන්ති ද මේ සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගී කරගන්නා කරුණක් වේ.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව එම ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක වනු ලබන්නේ නෛතික රාමුවක් තුළය. එමෙන්ම ව්‍යුහය, සංස්ථාපනය හා වගකීම්, බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ ද නෛතික රාමුවක් තුළය. තව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනත හා අනෙකුත් පනත්වලින් නෛතික ප්‍රතිපාදන මේ සඳහා සලසා දී ඇත.

ප්‍රාදේශීය සභාවේ අරමුණු හා කාර්යයන් ඉටු කිරීම සඳහා සෞඛ්‍ය සේවා, උපයෝගිතා සේවා, මංමාවත් විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම සභාවේ අරමුණු වන අතර, ඒ සඳහා මිනිස් ශ්‍රමය සහ ද්‍රව්‍ය උපකරණ, වාහන, ඉඩම්, ගොඩනැගිලි, මුදල් ඉතාමත් අත්‍යවශ්‍ය අංගයන් වේ. ප්‍රාදේශීය සභාවේ එම අරමුණු හා කාර්යයන් ඉටු කිරීම සඳහා එම වර්ෂය තුළ දී අවශ්‍ය වන සම්පත් සඳහා යෙදවිය යුතු මුදල් ප්‍රමාණය හා විවිධ මූලාශ්‍රවලින් මුදල් අය කරගන්නා ආකාරය පැහැදිළි කරමින් පිළියෙල කරන ආදායම් සහ වියදම් ඇස්තමේන්තුව ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනය වේ.

අයවැය ලේඛනය වැඩසටහන් 06කින් සමන්විත වේ.

- පොදු පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා
- සෞඛ්‍ය සේවා
- භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි
- ජල සේවා
- පොදු උපයෝගිතා සේවා
- සුභසාධක සේවා

<u>ප්‍රාදේශීය සභාවේ ආදායම් වර්ගීකරණය</u>

10 - වරිපනම් හා බදු
20 - කුලී
30 - බලපත්‍ර ගාස්තු
40 - සේවා සඳහා ගාස්තු
50 - වරෙන්තු ගාස්තු හා දඩ මුදල්
60 - වෙනත් ආදායම්
70 - ආදායම් ආධාර
80 - මූලධන හා ආධාර ලැබීම්

<u>ප්‍රාදේශීය සභාවේ වියදම් වර්ගීකරණය</u>

01 - වැටුප් හා දීමනා
02 - ගමන් වියදම්
03 - සැපයුම් හා උපකරණ
04 - ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව
05 - ප්‍රවාහක සම්බන්ධතා හා වෙනත් සේවා
06 - පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල්
07 - ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර
08 - විශ්‍රාම වැටුප්/විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික

<u>ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය</u>

09 - උපකරණ වැය/ ඉඩම් හා මංමාවත් වැඩි දියුණු කිරීම හා ගොඩනැගිලි වියදම්
10 - ණය ආපසු ගෙවීම්

**2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රධාන සාරාංශය**

**සැලසුම් කරන ලද ආදායම්/වියදම් පිළිබඳ විග්‍රහය**

පුනරාවර්ථන ආදායම
நடைமுறை வருமானம் — රු. 131,490,900.00
පුනරාවර්ථන වියදම
நடைமுறை செலவினம் — රු. 79,131,960.00
පුනරාවර්තන අයවැය අතිරික්තයநடைமுறை வரவு செலவு மீதம் — රු. 52,358,940.00
පුනරාවර්තන අයවැය අතිරික්තයෙන් ප්‍රාග්ධන වියදම
நடைமுறை வரவு செலவு மீதத்தின் நிலையான செலவு — රු. 52,358,410.00
පුනරාවර්තන අයවැය ශුද්ධ අතිරික්තය
நடைமுறை வரவு செலவுத்திட்ட தேறிய மீதம் — රු.530.00

**පුනරාවර්ථන ආදායම් හා වියදම් වැඩසටහන් අනුව**

| වැඩසටහන<br>வேலைத்திட்டம் | ආදායම வருமானம்<br>රු. | වියදම செலவினம்<br>රු. |
|---|---|---|
| 01 වැඩසටහන්<br>வேலைத்திட்டம் | 77,076,680.00 | 39,966,360.00 |
| 02 වැඩසටහන්<br>வேலைத்திட்டம் | 10,774,160.00 | 13,714,800.00 |
| 03 වැඩසටහන්<br>வேலைத்திட்டம் | 38,814,760.00 | 18,357,200.00 |
| 04 වැඩසටහන්<br>வேலைத்திட்டம் | 1,366,600.00 | 1,089,600.00 |
| 05 වැඩසටහන්<br>வேலைத்திட்டம் | 890,000.00 | 580,000.00 |
| 06 වැඩසටහන්<br>வேலைத்திட்டம் | 2,568,700.00 | 5,424,000.00 |
| එකතුව<br>மொத்தம் | 131,490,900.00 | 79,131,960.00 |

**2023- පුනරාවර්ථන ආදායම් ඇස්තමේන්තුව -2023**

| අනු අංකය<br>தொ.இல | වැඩසටහන வேலைத்திட்டம் | පුනරාවර්ථන ආදායම<br>நடைமுறை செலவினம்<br>රු. |
|---|---|---|
| 10 | වරිපනම් හා බදු<br>வரிப்பணம் மற்றும் குத்தகை | 5,982,520.00 |
| 20 | කුලී வாடகை | 20,937,500.00 |
| 30 | බලපත්‍ර ගාස්තු உரிமக்கட்டணம் | 1,325,100.00 |
| 40 | සේවා සඳහා ගාස්තු சேவைக்கட்டணம் | 9,429,500.00 |

| | | |
|---|---|---|
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ<br>பிடியாணை மற்றும் தண்டப்பணம் | 2,927,000.00 |
| 60 | වෙනත් ආදායම් ஏனைய வருமானம் | 49,716,500.00 |
| 70 | ආදායම් ආධාර நன்கொடை வருமானம் | 41,172,780.00 |
| | | **131,490,900.00** |

**2023 වර්ෂයේ පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තු සාරාංශය**

| අනු අංකය தொ.இல | වැඩසටහන வேலைத்திட்டம் | පුනරාවර්ථන වියදම நடைமுறை செலவினம் රු. |
|---|---|---|
| **1** | **වැටුප් හා දීමනා<br>சம்பளம் மற்றும் கொடுப்பனவு** | **51,301,120.00** |
| **2** | **ගමන් වියදම් பிரயாணச் செலவு** | **675,000.00** |
| **3** | **සැපයුම් හා උපකරණ<br>வழங்கல்கள் மற்றும் உபகரணங்கள்** | **8,346,500.00** |
| **4** | **ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව<br>நிலையான சொத்துக்கள் புதுப்பிப்பு மற்றும் பராமரிப்பு** | **8,500,000.00** |
| **5** | **ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා<br>போக்குவரத்து தொடர்புகள் மற்றும் ஏனைய சேவைகள்** | **5,023,000.00** |
| **6** | **පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල්<br>வட்டி கொடுப்பனவு, பங்கிலாபம்** | **2,551,600.00** |
| **7** | **ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර<br>நன்கொடை,சந்தா மற்றும் நிவாரணங்கள்** | **2,330,500.00** |
| **8** | **විශ්‍රාම වැටුප්/විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික<br>ஓய்வூதியம்/ஓய்வூதிய இலாபங்கள்** | **404,240.00** |
| | **එකතුව மொத்தம்** | **79,131,960.00** |

**2023 වර්ෂය සඳහා පුනරාවර්ථන අයවැය අතිරික්තයෙන් අපේක්ෂිත ප්‍රාග්ධන වැය**

| **අනු අංකය தொ.இல** | **විස්තරයවිபரம்** | **මුදල தொகை (රු.)** |
|---|---|---|
| 1 | කාර්යාලය සඳහා ලී බඩු හා උපකරණ அலுவலக தளபாடங்கள் மற்றும் உபகரணங்கள் | 50,000.00 |
| 2 | උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතචක්‍රීකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම உலப்பனைடென்மார்க் கழிவு மீள்சுழற்சி நிலையத்தை விருத்தி செய்தல் | 250,000.00 |
| 3 | කාර්යාලය සඳහා පරිගණක හා උපාංග /ප්‍රින්ටර් கணினி மற்றும் உதிரிப்பாகங்கள்/பிரின்டர் | 450,000.00 |
| 4 | සංවර්ධන ව්‍යාපෘති ( ගරු සභාපති ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය) அபிவிருத்தி திட்டங்கள் (கௌரவ தலைவர் உள்ளிட்ட சபை உறுப்பினர்கள்) | 26,000,000.00 |
| 5 | සංවර්ධන ව්‍යාපෘති ( සභා අරමුදල් - වෙනත්)அபிவிருத்தி திட்டங்கள்(சபை நிதி, ஏனையவை) | 4,000,000.00 |

| | | |
|---|---|---|
| 6 | පුස්තකාල පොත් ලබාගැනීම | 500,000.00 |
| 7 | දේශීය ණය හා සංවර්ධන අරමුදලට ණය වාරික ගෙවීම தேசிய கடன் மற்றும் அபிவிருத்தி நிதியத்துக்கு தவணை கடன் செலுத்துதல் | 8,808,410.00 |
| 8 | කාය වර්ධන මධ්‍යස්ථානයට උපකරණ ලබාදීම உடற் கட்டமைப்பு நிலையத்திற்கு உபகரணங்கள் வழங்குதல் | 100,000.00 |
| 9 | පුස්තකාල සඳහා කාර්යාල උපකරණ/ලී බඩු ලබා ගැනීම நூலகத்துக்காக அலுவலக உபகரணங்கள்/மரத்தளப்பாடங்கள் பெற்றுக்கொள்ளல் | 100,000.00 |
| 10 | සංචාරක ආකර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීම (අසුපිණිඇල්ල සංචාරක ව්‍යාපෘතිය) சுற்றுலா தலங்களை அபிவிருத்தி செய்தல் (அசுப்பிணி எல்ல சுற்றுலாத்துறை செயற்திட்டம்) | 2,000,000.00 |
| 11 | කුරුළුවත්ත නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම குருந்துவத்த புதிய வியாபார கட்டிடத்தொகுதியை நிர்மாணித்தல் | 10,000,000.00 |
| 12 | වැඩ ඒකකය සඳහා උපකරණ வேலை நிலையத்திற்கான உபகரணங்கள் | 100,000.00 |
| | **මුළු එකතුව மொத்தம்** | **52,358,410.00** |

**2023 වර්ෂය සඳහා ලැබේ යැයි අපේක්ෂිත ප්‍රාග්ධන ආධාර**

| **අනු අංකය தொ.இல** | **විස්තරයවිபரம்** | **මුදල தொகை (රු.)** |
|---|---|---|
| 01 | පළාත් සභා මන්ත්‍රී ආධාර/ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/තුලිත ආර්ථික/ හුදෙකලා හා පසුගාමී සංවර්ධන වැඩසටහන/ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශ ප්‍රදාන | 65,000,000.00 |
| | **මුළු එකතුවමொத்தம்** | **65,000,000.00** |

**පුනරාවර්ථන ආදායම් ඇස්තමේන්තු සාරාංශය**

| **අය සංකේතය வரவுக்குறியீடு** | **2021 සත්‍ය ආදායම மெய்வருமானம் රු.** | **2022 ඇස්තමේන්තුව மதிப்பீடுரு.** | **2023 ඇස්තමේන්තුව மதிப்பீடு ரு.** |
|---|---|---|---|
| **10 - වරිපනම් හා බදු வரிப்பணம் மற்றும் குத்தகை** | **3,311,315.00** | **4,435,115.00** | **5,982,520.00** |
| **20 - කුලී வாடகை** | **7,322,256.00** | **19,903,000.00** | **20,937,500.00** |
| **30 - බලපත්‍ර ගාස්තු உரிமக்கட்டணம்** | **1,034,250.00** | **1,175,100.00** | **1,325,100.00** |

| | | | |
|---|---|---|---|
| 40 - සේවා සඳහා ගාස්තු சேவைக்கட்டணம் | 6,154,927.00 | 10,557,000.00 | 9,429,500.00 |
| 50 - වරෙන්තු ගාස්තු හා දඩ பிடியாணைக்கட்டணம் மற்றும் தண்டப்பணம் | 1,461,975.00 | 2,247,000.00 | 2,927,000.00 |
| 60 - වෙනත් ආදායම් ஏனைய வருமானங்கள் | 27,164,636.00 | 28,039,500.00 | 49,716,500.00 |
| 70 - ආදායම් ආධාර நன்கொடை வருமானம் | 20,543,890.00 | 38,228,497.00 | 41,172,780.00 |
| මුළු එකතුවමொத்தம் | 66,993,249.00 | 104,585,212.00 | 131,490,900.00 |

පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තු සාරාංශය

| වැය சங்கேதயசெலவினக்குறியீடு | 2021 සත්‍ය වියදම மெய் செலவினம் රු. | 2022 ඇස්තමේන්තුව மதிப்பீடு රු. | 2023 ඇස්තමේන්තුව மதிப்பீடு රු. |
|---|---|---|---|
| 1 - වැටුප් හා දීමනාசம்பளம் மற்றும் கொடுப்பனவுகள் | 34,584,374.00 | 42,248,457.00 | 51,301,120.00 |
| 2 - ගමන් වියදම්பிரயாணச்செலவு | 428,495.00 | 675,000.00 | 675,000.00 |
| 3 - සැපයුම් හා උපකරණவழங்கல்கள் மற்றும் உபகரணங்கள் | 5,962,193.00 | 6,539,000.00 | 8,346,500.00 |
| 4 - ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුවநிலையான சொத்துக்கள் புதுப்பிப்பு மற்றும் பராமரிப்பு | 3,523,848.00 | 4,650,000.00 | 8,500,000.00 |
| 5 - ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවාபோக்குவரத்துடன் தொடர்புடைய ஏனைய சேவைகள் | 3,088,602.00 | 4,406,500.00 | 5,023,000.00 |
| 6 - පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් வட்டி செலுத்துதல், பங்கிலாபம், வெகுமதிகள் | 793,964.00 | 1,539,098.00 | 2,551,600.00 |
| 7 - ආධාර මුදල් දායක මුදල් හා සහනාධාරநன்கொடை சந்தா மற்றும் நிவாரணங்கள் | 630,173.00 | 1,833,500.00 | 2,330,500.00 |
| 8 - විශ්‍රාම වැටුප්/විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික ஓய்வூதியம்/ஓய்வூதிய இலாபங்கள் | 161,102.00 | 404,240.00 | 404,240.00 |

පුනරාවර්තන ආදායම් අය-වැය සාරාංශය

| | **අය විෂයන්** வருமான விபரங்கள் | **පොදු පරිපාලනය** பொது நிர்வாகம் | **සෞඛ්‍ය සේවා** சுகாதார சேவை | **භෞතික සැලසුම්** பௌதீக திட்டமிடல் | **ජල සේවා** நீர் சேவை | **පොදු උපයෝගිතා සේවා** பொது பயன்பாட்டு சேவை | **සුභ සාධක සේවා** நலன்புரி சேவை | **එකතුව** மொத்தம் | **ප්‍රතිශතය** சதவீதம் **%** |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | **5** | **6** | | |
| 10 | **වරිපනම් හා බදු** | 5,331,520.00 | 650,000.00 | - | - | - | 1,000.00 | 5,982,520.00 | 4.55 % |
| 20 | **කුලී මුදල්** | - | - | 20,100,000.00 | - | 815,000.00 | 22,500.00 | 20,937,500.00 | 15.92% |
| 3 | **බලපත්‍ර** | | | | - | | - | | 1.01 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | ගාස්තු | 600,100.00 | 650,000.00 | - | | 75,000.00 | | 1,325,100.00 | % |
| 40 | සේවා සඳහා ගාස්තු | 152,000.00 | 100,000.00 | 8,350,000.00 | 60,000.00 | - | 767,500.00 | 9,429,500.00 | 7.17 % |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 2,300,000.00 | 10,000.00 | 610,000.00 | 2,000.00 | - | 5,000.00 | 2,927,000.00 | 2.23 % |
| 60 | වෙනත් ආදායම් | 43,970,000.00 | 4,540,000.00 | 385,000.00 | 803,000.00 | - | 18,500.00 | 49,716,500.00 | 37.81% |
| 70 | ආදායම් ආධාර | 24,723,060.00 | 4,824,160.00 | 9,369,760.00 | 501,600.00 | - | 1,754,200.00 | 41,172,780.00 | 31.31% |
| | පුනරාවර්තන ආදායම් එකතුව | 77,076,680.00 | 10,774,160.00 | 38,814,760.00 | 1,366,600.00 | 890,000.00 | 2,568,700.00 | 131,490,900.00 | 100 % |
| | අඩුකලා கழித்தல் :- | | | | | | | | |
| | පුනරාවර්තන වියදම් | 39,966,360.00 | 13,714,800.00 | 18,357,200.00 | 1,089,600.00 | 580,000.00 | 5,424,000.00 | 79,131,960.00 | |
| | පුනරාවර්තන වියදමට වඩා අඩු වැඩි වූ ආදායම | 37,110,320.00 | (2,940,640.00) | 20,457,560.00 | 277,000.00 | 310,000.00 | (2,855,300.00) | 52,358,940.00 | |

## 2023 වර්ෂය - පුනරාවර්තන වියදම් අයවැය සාරාංශය

| | අය විෂයන් வருமான விபரங்கள் | පොදු පරිපාලනය பொது நிர்வாகம் | සෞඛ්‍ය සේවා சுகாதார சேவை | භෞතික සැලසුම් பௌதீக திட்டமிடல் | ජල සේවා நீர் சேவை | පොදු උපයෝගී තා සේවා பொது பயன்பாட்டு சேவை | සුභ සාධක සේවා நலன்புரி சேவை | එකතුව மொத்தம் | ප්‍රතිශතය சதவீதம் % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | | |
| 1 | වැටුප් හා දීමනා சம்பளமும் கொடுப்பனவும் | 29,877,060.00 | 9,170,360.00 | 9,626,100.00 | 601,600.00 | - | 2,026,000.00 | 51,301,120.00 | 64.83% |
| 2 | ගමන් වියදම් பிரயாணச் செலவு | 260,000.00 | 30,000.00 | 370,000.00 | 5,000.00 | - | 10,000.00 | 675,000.00 | 0.85% |
| 3 | සැපයුම් හා උපකරණ வழங்கல்கள் மற்றும் உபகரணம் | 3,519,500.00 | 2,795,000.00 | 1,475,000.00 | 257,000.00 | - | 300,000.00 | 8,346,500.00 | **10.55%** |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු | 2,750,000.00 | 900,000.00 | 3,200,000.00 | 150,000.00 | 500,000.00 | 1,000,000.00 | 8,500,000.00 | **10.74%** |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යක සේවා போக்குவரத்துடன் தொடர்புடைய அவசிய சேவைகள் | 3,161,000.00 | 469,000.00 | 633,000.00 | 75,000.00 | 80,000.00 | 605,000.00 | 5,023,000.00 | **6.35%** |
| 6 | පොලී ගෙවීම්/ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | - | 2,551,600.00 | | - | - | 2,551,600.00 | **3.22%** |
| 7 | ආධාර දායක මුදල් நன்கொடை பங்களிப்பு | 277,000.00 | 106,000.00 | 463,500.00 | 1,000.00 | - | 1,483,000.00 | 2,330,500.00 | **2.95%** |
| | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **8** | **විශ්‍රාම වැටුප් දායක මුදල්** ஓய்வூ தியபங்களிப்புத்தொகை | 121,800.00 | 244,440.00 | 38,000.00 | - | - | - | 404,240.00 | **0.51%** |
| | **මුළු එකතුව** மொத்தம் | **39,966,360.00** | **13,714,800.00** | **18,357,200.00** | **1,089,600.00** | **580,000.00** | **5,424,000.00** | **79,131,960.00** | **100%** |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයේ ආදායම් වියදම් සාරාංශය පිළිබඳ සාකච්ඡා කිරීමේදී පුනරාවර්ථන ආදායම රු.131,490,900.00 ක්ද ප්‍රාග්ධන ලැබීම් රු.65,000,000.00ක් ද වශයෙන් අපේක්ෂිත මුළු ආදායම් එකතුව රු.196,490,900.00ක් වේ. පුනරාවර්ථන වියදම රු.79,131,960.00ක්ද ප්‍රාග්ධන වියදම රු.117,358,410.00ක්ද අපේක්ෂිත මුළු වියදම් එකතුව රු.196,490,370.00 ක්ද වේ. එසේම ආදායම් වියදම් සාරාංශය හා වැඩසටහන් විස්තරාත්මකව මෙම අයවැය ලේඛනයේ සඳහන් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම අයවැය ලේඛනය ඉතාම අසීරුවෙන් සකස් කරන ලද අයවැය ලේඛනයක්.රුපියල් කෝටි තුනක් ගඟ ඉහළ කෝරළේ බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වෙන් කිරීමට නිලධාරීන් ඔවුන්ට ලැබෙන දීමනා ,ගමන් වියදම් ද පරිත්‍යාග කර තිබෙන බව මෙහිදී සිහිපත් කළ යුතුයි.මේ ආකාරයෙන් ලක්ෂ විස්ස බැගින් ගමේ සංවර්ධනය සඳහා යෙදවීමට හැකියාව ලැබුණේ අපගේ දේශපාලන නායක ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ බව ගෞරවයෙන් සිහිපත් කරනවා.මෙම අයවැය පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි,පළාත් පාලන ආයතනයක වසර පහළොවක් මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කිරීමේදී අයවැය ගණනාවකට මුහුණ දී තිබෙනවා.මෙවර අයවැය තුළින් ගමට සේවය කළහැකි අන්දමට විශාල මුදලක් ලබා දී තිබෙනවා.වර්තමානයේ පවතින තත්ත්වය තුළ මාර්ග සංවර්ධනය,සමාජීය.ආර්ථික හා ආකල්පමය සංවර්ධනය ඇති කිරීම කළයුතුයි.නමුත් මෙම ප්‍රතිපාදන යොදාගෙන පවතින ආර්ථික අර්බුදය සමග විනාශ වී ඇති මාර්ග යම් මට්ටමකට සංවර්ධනය කිරීමේ හැකියාව තිබෙනවා.අප සියලු දෙනා මන්ත්‍රීධූර හෙබවූ මෙම කාලය තුළ උලපනේ කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ඉතා අසීරුවෙන් ආරම්භ කර අද වන විට ආදායම් උත්පාදනය කරන තිරසාර සංවර්ධන ව්‍යාපෘතියක් බවට පත්ව තිබෙනවා.හිටපු සභාපතිවරු මෙම ගොඩනැගිලි සාදා දුප්පත්ව තිබූ ප්‍රාදේශීය සභාව මේ තත්ත්වයට ගෙනැවිත් තිබෙනවා.වර්තමානයේ පළාත් පාලන ආයතන අතර තරගවලින් ප්‍රථම, දෙවන ,තෙවන ස්ථාන ලබන තත්ත්වයට මෙම ප්‍රාදේශීය සභාව වර්ධනය වී තිබෙනවා.මේ සියල්ල නිලධාරීන්ගේ සහ මන්ත්‍රී මණ්ඩලයේ කැපවීමෙන් සිදුවූවක්.කාලෝචිත හා වර්තමාන ආර්ථික තත්ත්වයට ගැළපෙන අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව මාගේ කෘතඥතාවය පිරිනමනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි,ගරු ස්වාමීන් වහන්ස,සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි,ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා දේශපාලනයට පිවිසීමත් සමග ගඟ ඉහළ කෝරළයේ තිරසාර සංවර්ධනයක් ඇති කළ බව පක්ෂ භේදයකින් තොරව අප සියලු දෙනා පිළිගන්නවා.හිටපු සභාපතිවරු තිදෙනෙක් මේ සභාවේ සිටිනවා.එතුමන්ලාගේ කාල වකවාණු තුළත් එවකට ලැබුණු ප්‍රතිපාදන අනුව යම් වැඩකොටසක් සිදුකරනු ලැබුවා.ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ ධුර කාලය තුළත් සුවිශාල වැඩකොටසක් සිදුකර තිබෙනවා.ඒ සම්බන්ධයෙන් ඔබතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට සහ කාර්යය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා.හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම පිළිබඳවත් අප විශාල අවධානයකින් යුක්තව සිටියා.විශාල සංවර්ධන කටයුත්තක් ඒ සමයේදීත් සිදුවුණා. එසේ ම අප සියලු දෙනාගේ ම ජනාධිපතිවරයා අපේ වත්මන් නායකතුමා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආශිර්වාදයෙන් මෙම වසරේ අයවැය ඉදිරිපත් කෙරෙන බවත් සිහිපත් කිරීම සුදුසු බව මගේ අදහසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා</u>

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමනි,සෑම රජයක්ම සෑම පළාත් පාලන අයතනයකම අයවැයක් තුළ සිදු නොකළ දෙයක් නෑ.එහි සඳහන් යම් දෙයක් හෝ සෑම ආයතනයක් ම සිදුකර තිබෙනවා.නමුත් ගැටළුව වන්නේ අයවැය සාමාන්‍ය ජන ජීවිතය සමග කෙතරම් බද්ධ වූවාද යන්නයි.ගරු සභාපතිතුමනි .ඔබතුමා ඉදිරිපත් කරන අයවැය යෝජනා සියල්ලක්ම නරක නැති නමුත් සමස්තයක් වශයෙන් මා මේ අයවැය සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර සිටිනවා.විරුද්ධ වීම සඳහා බලපාන කරුණු කිහිපයක් තිබෙනවා. බදු වැඩි කිරීම, සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රමිතිය ආදිය සැලකිල්ලට ගෙන මෙම අයවැය සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.බදු පනවනවා සේම එම බදු එකතු කර ගැනීමේදී සෑමවරම යම් හිදැසක් ඉතිරිවෙනවා.සම්පූර්ණ බදු මුදල් එකතු කරගැනීමක් සිදුවන්නේ නැහැ.එසේම රට හෝ පළාත් පාලන ආයතන මේ තත්ත්වයට පත්ව තිබෙන්නේ ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති යනුවෙන් හඳුන්වන ව්‍යාපෘතිවල සාර්ථක අසාර්තකත්වය මතයි.ප්‍රාදේශීය සභාවක් වශයෙන් හුදෙකලාව කටයුතු කිරීම අපහසුවන අතර මධ්‍යම රජයෙ උදව් උපකාර අවශ්‍ය වෙනවා.වර්තමානය වන විට රට මේ තත්ත්වයට පත්ව තිබෙන්නේ වසර ගණනාවක් පුරා අනුගමනය කළ වැරදි ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙනි.කෙසේ වුවත් රටක් වශයෙන් ඉදිරියට යාමට නම් රට ස්ථාවර වියයුතු වන අතර ඒ සඳහා මැතිවරණයක් පැවත්විය යුතු වෙනවා.ස්ථාවර රජයක් යටතේ පළාත් පාලන ආයතනවලට ස්ථාවර ගමනක් යාහැකියි.ගරු සරත් කුමාර ලාල් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි එතුමාගේ නායකතුමාගේ නම රටේ නායකතුමා වශයෙන් සඳහන් කිරීම සුදුසු නමුත් මින් පෙර නම් එතුමාගේ නම සඳහන් කෙරුණේ 94 වරක් බුද්ධි අංශ මගින් තොරතුරු ඉදිරිපත් කර තිබියදීත් පාස්කු ප්‍රහාරය වළක්වාගත නොහැකි වූ සහ මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙනුයි.කෙසේ වෙතත් වර්තමාන ජනාධිපතිවරයා වශයෙන් එතුමාත් පවතින ආර්ථික අර්බුදයෙන් රට ගොඩගැනීමට අපොහොසත් වී තිබෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා</u>

ගරු සභාපතිතුමනි, අද දින පොදුජන එක්සත් පෙරමුණේ සභාපතිවරයා වශයෙන් ගරු ධම්මික නදීර ජයසේකර මැතිතුමාට යථාර්ථවාදී අයවැයක් ඉදිරිපත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මම බෙහෙවින් සතුටු වෙනවා.මේ මොහොතේ පවතින දේශපාලන රටාව අනුව ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීවරයා හැරුණු විට අනෙක් මන්ත්‍රීවරුන් යම් එකඟතාවයකට පත්ව සිටින බව මගේ හැඟීමයි.මෙම අයවැය වැඩසටහන් කිහිපයකට සීමා වී ඇති අතර ප්‍රාදේශීය සභාවකට කළහැකි කාර්යයන් යම්කිසි සීමාවකට යටත් වෙනවා.ඇතැම් අවස්ථාවල එම සීමා ඉක්මවා කටයුතු කළහැකි අවස්ථා තිබෙනවා.පොදු පරිපාලනය,සෞඛ්‍ය,භෞතික සැළසුම් ,පොදු සේවා සහ සුභසාධන සේවා යන වැඩසටහන් වැය විෂයන් හා අය විෂයන් වශයෙන් නිත්‍ය වශයෙන්ම වෙන් කර තිබෙනවා.සභාවක් වශයෙන් මෙම කටයුතු කිරීමේදී අංශ දෙකක් පිලිබඳව සළකා බැලිය යුතුයි.එනම්,අප නියෝජනය කරන ජනතාව පීඩාවට පත් නොකොට ඔවුන්ගෙන් අය කරන බදු හා ගාස්තු අය කිරීමත් බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය සඳහා කටයුතු සිදුකිරීමයි.ඒ සඳහා අපට කිසියම් තුලනාත්මක තත්ත්වයකට පත්වීමට සිදුවෙනවා.ගරු මන්ත්‍රී එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා ප්‍රකාශ කළ පරිදි බදු මුදල් වැඩි කිරීමත් මේ අයවැයට විරුද්ධ වීමට හේතුවක් වී තිබෙනවා.නමුත් බදු මගින් උත්පාදනය කෙරෙන ආදායම සමස්ත ආදායමෙන් සියයට හතරක් පමණයි.ඉතිරි සියයට අනූ හය ලබාගන්නේ විවිධ සේවාවන් සැපයීමෙනුයි.ඒ අනුව සභාවක් වශයෙන් අප විශාල බදු බරක් ජනතාව මත පටවා නොමැති බව මගේ අදහසයි.වර්තමාන ආර්ථික අවපාතය සමග ඇතිවී තිබෙන ගැටළුකාරී තත්ත්වය දෙස බැලීමේදී මන්ත්‍රීවරයෙකු වශයෙන් මම ඉතා සතුටට පත්වෙන කාරණය නම් රට කුමන ගැටළුකාරී තත්ත්වයක පැවතුනත්, ආර්ථික වශයෙන් ප්‍රපාතයකට ගියත් ප්‍රාදේශීය සභාවක් වශයෙන් සභාපතිවරු ගණනාවක් යටතේ බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය පූර්ණ වශයෙන් නගා සිටුවිය නොහැකි වුවත් රටේ ආර්ථික තත්ත්වයට වඩා ඉහළින් ඔසොවා තැබූ බව කිව යුතුයි.මන්ත්‍රීවරයෙකු වශයෙන් එදා සභාව සතු වු වත්කම් ,ආදායම් මාර්ග පිළිබඳව හා සභාව පවත්වාගෙන ගිය ආකාරය පිලිබඳව හිටපු සභාපති ගරු ආනන්ද කුලතිලක මැතිතුමා සාක්ෂි දරාවි යැයි මා සිතනවා.

අපගේ අසහාය නායක ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් ගරු සභාපතිතුමාත් මන්ත්‍රීවරුන් සියලු දෙනාත් ඔවුන්ගේ කැපකිරීමෙන් සහ ලේකම්වරුන්ගේ සහ කාර්යය මණ්ඩලයේ උද්යෝගීමත්භාවයත් හේතුවෙන් ප්‍රාදේශීය සභාව දිනෙන් දින ඉදිරියට පැමිණියා.ගරු මහින්දරත්න අලුත්ගමගේ මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශයේ සඳහන්ව තිබූ කරුණක් වූයේ කුරුඳුවත්ත නගරය නවීන නගරයක් බවට පත්කළයුතුය යන්නයි.නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ විවිධ ආයතනවලින් ණය පහසුකම් ලබාගෙන ලෑලි කඩවලට පමණක් සීමා වූ කුරුඳුවත්ත නගරය නවීන නගරයක් බවට පත්කිරීමේ හැකියාව ලැබුණා.ඉන් නොනැවතුණු අපි ඇත්ගාල නගරය නිර්මාණය කළා.එසේම ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ පියාණන්ගේ දෑතේ

මහන්සියෙන් ගොඩනැගූ ගල්පාය පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල,කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, ගරු ගුණරත්න රාජපක්ෂ මැතිතුමාගේ ධුර කාලය තුළ අංග සම්පූර්ණ නවීන ගොඩනැගිල්ලක් දක්වා වර්ධනය කෙරුණා.පවතින තත්ත්වය මත ප්‍රාදේශීය සභා විසුරුවා හැරිය යුතු බව යමෙකුට කිව හැකි නමුත් ගඟ ඉහළ කෝරළයේ වත්කම පැවතුනේ මිලියන දහයක් වශයෙන් නම් වර්තමානයේ වත්කම බිලියන ගණනින් මැනිය හැකි තත්ත්වයට පත්ව තිබෙනවා.ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට සහ හිටපු සභාපතිවරුන්ට අඛණ්ඩ සහයක් ලබා දුන් මන්ත්‍රීවරයෙක් වශයෙන් මට ආඩම්බරයෙන් මෙම සභාවෙන් පිටව යාහැකියි.අපි තනතුරු පතා ආවේ නෑ.එදා පට්ටලාව,උඩුවැල්ල ප්‍රදේශ පැවති ආකාරයත් වර්තමානයේ පවතින ආකාරයත් දෙස බැලීමේදී අපට ඉතා සතුටු විය හැකියි.කාපට් ඇතිරූ මාර්ග,ප්‍රජා ශාලා,සෑම නිවසකටම ජල පහසුකම්, විදුලිය ලබාදී තිබෙනවා.මේ සභාවෙන් පිටව යන විට වැදගත් වන්නේ අප දරණ ලද තනතුර නොව මේ සභාව තුළ අප කළ සේවයයි.මම මේ සභාවේ මුලින් ම සභික ධුරයක් ලද කාල වකවාණුවේ වාර්ෂික ප්‍රතිපාදනවලින් වෙන් කර තිබුණේ රුපියල් විසිපන්දහසක් පමණයි. නමුත් වර්තමානයේ කෝටි දොළහක වියදමින් ඉතිහාසයේ දැවැන්තම ඉදිකිරීම වන කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකෙරෙමින් පවතිනවා.නාවලපිටිය ජනතාවගේ උන්නතිය වෙනුවෙන් නගරයේ රෝහල්,මං මාවත්,ප්‍රවාහන පහසුකම් ,ක්‍රීඩා පිටි ,පාසැල් ,නිවාස ඇති කර ඉතිහාසයේ පෙර නොවූ ආකාරයේ සුවිශාල සංවර්ධනයක් සිදු කළ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා අනාගතයේ යළි සිදුනොවන ආකාරයේ සංවර්ධනයක් සිදුකර තිබෙනවා.එතුමාගේ ආශිර්වාදයෙන් මෙවැනි සාර්ථක අයවැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු සභාපතිතුමනි,ඔබතුමාට මම බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා</u>

මූලාසනයේ ගරු සභාපතිතුමනි, 1948 පෙබරවාරි 4 වන දින නිදහස ලැබූ මෙරටට සර්ව ජන ඡන්ද බලය ලැබීමත් සමඟ විවිධ අගමැතිවරුන් හා ජනාධිපතිවරුන් යටතේ විදේශ ප්‍රතිපත්තිවලට අනුව ආර්ථික වශයෙන් ක්‍රමයෙන් වර්ධනය වූ අතර අප ප්‍රාදේශීය සභාවත් ඒ අනුව ශක්තිමත්ව වර්ධනය වූවා.එසේ ම සෑම අයවැයකදීම අයවැය හිඟය පියවා ගැනීමට විදෙස් රටවලින් ණය මුදල් ලබාගැනීමට වීමට සිදුවූ අතර 1971 සමගි පෙරමුණු ආණ්ඩුව යටතේ කිසිදු මූල්‍ය ආයතනයකින් ණය නොගෙන අයවැයක් ඉදිරිපත් කරන ලද්දේ ලොව ප්‍රථම අගමැතිනිය වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පමණයි.එතුමියගේ දුරදර්ශී නුවණින් වර්තමාන වසංගත තත්ත්වයන්ට මුහුණ දීමට ස්වයං පෝෂිත ආර්ථික ක්‍රමයක් සකස් කළත් ඒ සමයේදීත් ජනතාවට දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදුවුණා.ටයර් සංස්ථාව ,පොහොර සංස්ථාව,හිඟුරාන සීනි කර්මාන්ත ශාලාව ,පැලවත්ත සිනි කර්මාන්ත ශාලාව ආදී කර්මාන්ත ශාලා ඇති කෙරුණා.නමුත් ඒ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය තුළ පැවති දුෂ්කරතා නිමා කළ යුතුය යන අදහසින් 1978 විවෘත ආර්ථික ප්‍රතිපත්තියට යොමු වුණා.අද අපට දේශීය නිෂ්පාදනවලින් යැපීමේ ක්‍රමවේදයක් නෑ.ලෝක වෙළඳපොළේ ආහාර උද්ධමනය සියයට තුන්සියයකින් වැඩි වී තිබෙනවා.ව්‍යාපාර කඩා වැටී තිබෙනවා. වසර හැත්තෑවක් පුරා අප විසින් පත්කළ ආණ්ඩුවල නායකයන් ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් අද රට මේ තත්ත්වයට පත්වී තිබෙනවා.ඩොලර් බිලියන දාහතයි දශම පහක් අප ලෝකයට ණය වී තිබෙන අවස්ථාවක සියලු පක්ෂ එකතු වී ජාතික ප්‍රතිපත්තියක් ඇති කරගැනීමට උත්සහ කරන බවක්පෙනෙන්නේ නෑ.එවන් මොහොතක ගරු සභාපති ධම්මික නදීර බණ්ඩාර ජයසේකර මහතාට රුපියල් **131,490,900.00**ක පුනරාවර්තන ආදායමක් එකතු කරගෙන අපේක්ෂිත මුළු වියදම් එකතුව රු.**196,490,370.00** ක් වනපරිදි සකස් කරගෙන විසි ලක්ෂයක මුදලක් ගමේ සංවර්ධනය සඳහා යෙදවීමට හැකියාව ලැබී තිබෙනවා.හිටපු සභාපතිවරුන් යටතේ අද මේ තත්ත්වයට පැමිණීමට හැකි වූවා.

එසේ ම සිංහලයෙක් වශයෙන් ඉපදී හැට නව ලක්ෂයක බහුතර බෞද්ධ ඡන්දවලින් තේරී පත්වූ සිංහල බෞද්ධ නායකයෙක් ජනතා අරගලයකින් නෙරපීම සම්බන්ධයෙන් මම මගේ කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය හා ස්වෛරීභාවය නැති කරන්නට අවශ්‍ය රටවලින් ලද ඩොලර් මගින් සිදුවූ මෙම අරගලයට පක්ෂයේ ඇතැම් නායකයන්ගේ ද දුර්වලතා හේතු වූ අතර එකී හේතු නිසා එතුමාට ධුරයෙන් ඉවත්වන්නට සිදුවුණා.නිවැරදි වැඩපිළිවෙලක් සහිත නායකයෙකුට,දැක්මක් සහිත ඇමතිවරයෙකුට ,වැඩපිළිවෙලක් සහිත පක්ෂයකට මේ රටේ තැනක් නැහැ.එවන් අවස්ථාවක වත්මන් සභාපතිතුමා ප්‍රමුඛ ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය ජනතාව වෙනුවෙන් වැඩ කරන්නට උත්සහ කළා.අපගේ දේශපාලන නායක ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා එතුමා නියෝජනය කරන ජනතාවට සේවය කරන්නට හැම විටම උත්සහ කළා.අපෙන් සහ අපේ පක්සයෙන් යම් යම් අඩුපාඩු වී තිබෙන්නට හැකි නමුත් මින් ඉදිරියට එවැනි අඩුපාඩු නොවන සේ දැක්මක් සහිතව මේ රට ක්‍රියාත්මක කළ යුතුව පවතිනවා.හිටපු සභාපතිවරයෙක් වශයෙන් මා හට උප සභාපති ගරු මහින්දරත්න අලුත්ගමගේ මැතිතුමා සමග එක්ව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අටක් සහ විපක්ෂයේ මන්ත්‍රීවරු සිව්දෙනෙක් සමග එක්ව ප්‍රාදේශීය සභාව යම් තැනකට රැගෙන ඒමට හැකිවුණා.අපගේ දේශපාලන නායකත්වය සමග එක්ව සුවිශේෂී තැනකට මෙම ආයතනය ඔසොවා තැබීමට හැකිවීම පිළිබඳ අපට සතුටුවිය හැකියි.ඇත්ගාල නගරය සංවර්ධනය කිරීම පිළිබඳ ,ඇත්ගාල

ක්‍රීඩා පිටිය ,කුරුඳුවත්ත ක්‍රීඩා පිටිය,කුරුඳුවත්ත නගරය සංවර්ධනය පිළිබඳ සතුටු විය හැකියි.ජනතා ඡන්දයෙන් පත්වූ අප එම ජනතාවට ණය නොවී අපේ දේශපාලන පක්ෂයත් සමග එක්ව විශාල වැඩ කොටසක් ඉටු කළා.නැවත මේ රට ගොඩනැංවීමට නම් අපට යම් කැපකිරීමක් සිදුකළයුතු වෙනවා.අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ අවසන් අයවැය සඳහා මා සුබපතන අතර එම අයවැය නිර්මාණශිලීව සකස් කළ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ කැපවීම අගය කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි,ගඟ ඉහළ කොරළේ ජනතාවගේ දියුණුව උදෙසා ප්‍රදේශයේ යටිතල පහසුකම් හා වෙනත් පහසුකම් සැපයීම වෙනුවෙන් ගරු සභාපතිතුමා විසින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ඔබතුමාට මගේ සහයෝගය ලබා දෙනවා.ගරු සභාපතිතුමා විසින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබාදෙන වරප්‍රසාද දොලොස්බාගේ වසම නියෝජනය කළ මා හට ලබා දීම පිළිබඳව ඔබතුමාට මාගේ විශේෂ ස්තූතිය පිරිනමනවා.ඔබතුමාගෙන් ලද එම ශක්තිය හේතුවෙන් අපට අපගේ කොට්ඨාසය තුළ යම් යම් සංවර්ධන කටයුතු කරන්නට හැකිවුණා.දොලොස්බාගේ නගරයට වැසිකිළි පහසුකම් නොමැති අවස්ථාවේ සභා අරමුදලින් එම කාර්යය ඉටුකර දුන්නා.ඔබතුමාගේ නිල කාලය තුළ යම් සංවර්ධන කටයුත්තක් සිදු කළහැකි වුවා නම් අපත් එම කාලය තුළ සභාව නියෝජනය කිරීම සම්බන්ධයෙන් අපටත් සතුටු විය හැකියි.මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් කළත් ඉදිරියේදී දේශපාලනය කළ ද නොකළ ද ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා සමග කටයුතු කරන බව සඳහන් කළ යුතුයි.එයට හේතුව නම් එතුමා ගමට පැමිණ සියල්ල සොයාබලා කටයුතු කිරීමයි.අප බලාපොරොත්තු වන ආකාරයේ දැවැන්ත සංවර්ධනයක් කොට්ඨාසය තුළ සිදුකළ නොහැකි වුවත් අප කටයුතු කළ යුත්තේ අපේ ආසනයේ නායකත්වය සමගයි.මේවන විටත් දොලොස්බාගේ මාර්ගය ගමන් කළ නොහැකි තත්ත්වයක පවතින බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් මාර්ගයේ බස්රථ ධාවනය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.ගඟ ඉහළ ඉතිහාසයේ ප්‍රථම වරට භික්ෂුන් වහන්සේ නමක් වශයෙන් මන්ත්‍රීධුරයක් ලද පළමු තැනැත්තා වශයෙන් නැවත වරක් මන්ත්‍රී ධුරයක් නොලැබුන ද මගෙන් ඉටු විය යුතු සේවය ඉටු කිරීමට අවශ්‍යයි. ලක්ෂ විස්සක් සංවර්ධන යෝජනා සඳහා වෙන්කොට තිබෙනවා.මගේ කොට්ඨාසය නියෝජනය කරන තවත් මන්ත්‍රීවරු තිදෙනෙක් සිටින අතර ඔවුන් ද කොට්ඨාසය තුළ සංවර්ධන කටයුතු කිරීමේ අපේක්ෂාවෙන් සිටිනවා.ගඟ ඉහළ කොරළේ ජනතාව වෙනුවෙන් ඔබතුමා 2023 වර්ෂය සඳහා සම්පාදනය කළ අයවැය මගින් ලබා දී ඇති සහන පිළිබඳව බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි,මම 2006 ප්‍රාදේශීය මහාවට සභාපති වශයෙන් තේරී පත්ව පැමිණෙන විට මහා සභාවේ භාවිතා කළ හැකි මට්ටමේ එකදු පුටුවක් හෝ තිබුණේ නැහැ.රුපියල් හැත්තෑ දෙදහසකට පුටු දහතුනක් දිනපාල ආයතනයෙන් ණයට ලබාගෙන අපි මෙම සභාව ආරම්භ කළා.නමුත් අද කෝටි දාහතරක ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා යොදවනවා.එම නිසා අප නිවැරදි තීරණ,ප්‍රතිපත්ති මත පිහිටා නිවැරදි නායකයන් සමග කටයුතු කළ බවට අපට විශාල සතුටක් තිබෙනවා.මම සභාපති වශයෙන් පත්ව ආ අවස්ථාවේ මට සිටියේ ලේකම්වරයෙක් නොව ප්‍රධාන ලිපිකරු මහතෙක් පමණයි.එතුමා මට පනත අනුව නීත්‍යානුකූලව කටයුතු කිරීමට බොහෝ සෙයින් උපකාර කළ බව මෙහිදී සිහිපත් කළ යුතුයි.එසේම අපේ පතිරණ මන්ත්‍රීතුමා අප දේශපාලන ජීවිතය තුළ කිසිදු දේශපාලන ඇගයීමකට ලක් නොවීම පිළිබඳ මට විශාල කණගාටුවක් තිබෙනවා.එතුමා විජයානන්ද ඇමතිතුමාගේ සහ මහින්දානන්ද ඇමතිතුමාගේ දේශපාලන ගමන තුළ සිටි ප්‍රධාන පුරුකක් වශයෙන් හැඳින්විය හැකියි.එසේම අපට ශක්තියක් වුණු සියලු දෙනා සිහිපත් කළ යුතුයි.ආසියානු සංවර්ධන බැංකුවෙන් ලක්ෂ විසි හතක් ලබාගෙන කුරුඳුවත්ත නව නගරය සංවර්ධනය කළා.දෙකොටි හැට පන්ලක්ෂයක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරමින් අපි ඇත්ගාල නගරය සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලැබුවා.කොරෝනා වසංගතය වෙනුවෙන් සංවර්ධනය සඳහා යෙදවිය හැකිව තිබූ මුදල් විශාල ප්‍රමාණයක් වැය කිරීමට සිදුවුවා.නව වසරකට පා නගන මේ මොහොතේ මෙම අය වැය සාර්ථක අයවැයක් බවට පත්වන්නේ මෙහි සඳහන් කරුණු නිසි ලෙස ක්‍රියාවට නැංවුවහොත් පමණයි.විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් යම් ප්‍රතිපාදන මුදලක් සංවර්ධන කටයුතු සඳහා ලබා දීමට යෝජනා කර තිබෙන අතර ඒ සඳහා ද අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.ඔබතුමා ඉදිරිපත් කළ මෙම අයවැය සඳහා මාගේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය

ගරු සභාපතිතුමනි,ගඟ ඉහළ කොරලේ ප්‍රාදේශීය සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරියක් වශයෙන් සහ තේරීපත්වුණු ප්‍රථම කාන්තා නියෝජිතවරිය වීමත් සම්බන්ධයෙන් මම සතුටු වෙනවා.වත්මන් ගරු සභාපතිතුමා යටතේ මට මේ සභාව කෙටි කාලයක් හෝ නියෝජනය කළහැකිවීම පිළිබඳවත් සතුටු වෙනවා.2002 වර්ෂයේ පැවති අදූරදර්ශී පාලන කාලයේ ගරු මහ ඇමති ඩබ්.පී.බී.දිසානායක මහතා විසින් යම් ප්‍රතිපාදන මුදලක් වෙන් කර දුන් නිසා ප්‍රදේශයට කාලාන්තරයක් පුරා සිදුකළ නොහැකි වූ සංවර්ධන කටයුතු සිදු කිරීමට හැකියාව ලැබුණා.ගරු ස්වාමීන්වහන්සේට ලැබෙන ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන මුදල්වලින් උන්වහන්සේත් සංවර්ධන කටයුතු කරන්නේ දොළොස්බාගේ ප්‍රදේශයටමයි.උන්වහන්සේ කරන ඒ සංවර්ධන කටයුතුවලට සහයෝගය දැක්වීමට ලැබීම ගැන මම ඉතා සතුටු වෙනවා.මමත් 2023 වර්ෂය සඳහා යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.අපටත් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරීම සඳහා සහයෝගය ලබාදෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.ඔබතුමා මේ ඉදිරිපත් කරන අයවැයට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරියක් වශයෙන් මගේ පූර්ණ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරනවා.එසේම මෙම අයවැය තුළින් ගඟ ඉහළ කොරලේ ප්‍රාදේශීය සභාව තුළ විශාල සේවයක් කිරීමට ඔබ සියලු දෙනාට හැකි වේවායි ප්‍රාර්ථනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි,2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන මෙම අයවැය ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ හයවන සභාපතිවරයා වශයෙන් ඉදිරිපත් කරන අවස්ථාවේ එම මොහාතට සම්බන්ධවීමට ලැබීම මගේත් භාග්‍යයක් ලෙස මා සළකනවා.ඔබතුමා මන්ත්‍රී මණ්ඩලය සහ ලේකම්තුමිය ප්‍රමුඛ කාර්යය මණ්ඩලය සමග එක්ව මෙම අයවැය සකස්කර තිබෙන්නේ ගඟ ඉහළ කෝරලේ සිංහල ,දෙමළ.මුස්ලිම් සියලු ජනතාවගේ සුබ විහරණය සඳහායි.නමුත් ගරු සභාපතිතුමනි මේ අයවැය සකසන රටාව දැන් වෙනස් විය යුතුයි.පුනරාවර්තන ආදායම්,පුනරාවර්තන වියදම්,ප්‍රාග්ධන ආදායම්.ප්‍රාග්ධන වියදම් යන ශීර්ෂවලට වෙන්කර තිබෙන නමුත් වර්තමාන සමාජයේ තරුණ ප්‍රජාවේ අදහස් දෙස බැලීමේදී මෙයට වඩා ආදායම් උත්පාදනය කෙරෙහි අවධානය යොමු කර නව ක්‍රමවේදයකට යායුතු බව මගේ අදහසයි.මම සභාපති ධූරය දැරූ කාලයේ රාක්ෂාව ,දොළොස්බාගේ,උලපනේ යන ප්‍රදේශවලින් පමණක් වරිපනම් අය කෙරුණු අතර අපට අදටත් අපේ වරිපනම් කලාපය වෙනස් කිරීමට හැකියාව ලැබී නැහැ.ඒ වගේම ගම්පොළ සිට උලපනේ දක්වා කුරුඳුවත්ත විශාල දියුණුවක් ලබා තිබෙනවා.අපට විදුලි උත්පාදනය සඳහා සෝලා ක්‍රමය උපයෝගී කර ගත හැකියි.එසේම සශ්‍රීක භූමියක් අප සතුව තිබෙනවා.අප විශාල සේවාවක් සපයා තිබෙනවා.1991 වර්ෂයේ සභාපති වශයෙන් පත්වන විට ගල්පාය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලෙහි විදුලිය පවා විසන්ධි කර තිබුණා.ඔබතුමන්ලාට සභාපති ධූරය ලැබුණේ හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ ආශිර්වාදයත් සමගයි.එතුමා මෙම බල ප්‍රදේශයේ සංවර්ධනයට අවශ්‍ය සහයෝගය ලබාදුන්නා.නමුත් මම සභාපති වන විට රජයේ මුදල් තිබුණේ නැහැ .පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ විසිපහක් ලබාදුන් අතර මම සභාවේ පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ට රුපියල් පනස්දහස බැගින් සංවර්ධන කටයුතු සඳහා ලබා දුන්නා.නමුත් අද වන විට ලක්ෂ විස්සක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට සංවර්ධන කටයුතු සදහා ලැබෙනවා.මුදලේ අගය අඩු වීමක් මෙන්ම සභාවේ ආදායම් වැඩි වීමකුත් පවතින බව මේ අනුව පෙනීයනවා.ඔබතුමා මේ ප්‍රාදේශීය සභාවට නායකත්වය දෙමින් මෙහි දියුණුව වෙනුවෙන් කටයුතු කෙරුවා.අප විපක්ෂය වශයෙන් ගැටුම් ඇතිකරගත්තේ නැහැ.මෙම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් වශයෙන්,විපක්ෂ නායකවරයෙක් වශයෙන්.මන්ත්‍රීවරයෙක් වශයෙන් බල ප්‍රදේශයේ ජනතාවට යම් කිසි සේවයක් කරන්නට ලැබුණා නම් මා ඒ සම්බන්ධයෙන් සතුටට පත්වෙනවා.එදා සිට මේ දක්වා මා සමඟ සිටි එක්සත් ජාතික පක්ෂයේ සහෝදර පාක්ෂිකයන්ට මගේ ගෞරවණීය ස්තූතිය පිරිනමනවා.ගඟ ඉහළ කොරලේ ජනතාවට සේවය කිරීමට පක්ෂ භේදයකින් තොරව සහෝදරත්වයෙන් යුතුව ජීවත්වීමට වර්තමානයට සහ අනාගතයට සුදුසු ලෙස හැඩ ගැසීමටත් අප සියලු දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමනි,මහනුවර නගර සභාවෙන් ආදායම් පරීක්ෂකවරු දස දෙනෙකු ගෙන්වා ඉදිරියේදී වරිපනම් දේපළ හඳුනාගෙන මීළග කාර්තුවෙන් පසු වරිපනම් අය කර සභාවේ ආදායම වැඩි කරගැනීමට මේ වන විට වැඩපිළිවෙලක් සකස් කර තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

ගරු සභාපතිතුමනි,2023 අයවැය සෑදීමේදී ජනතාවට විශාල බදු බරක් පටවා මෙම අයවැය සකස් කළ බවට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීවරයා ප්‍රකාශ කළත් ප්‍රාදේශීය සභාවක් වැනි ආයතනයක්

ගෙනයාමේදී ජනතා සහයෝගය අත්‍යවශ්‍යයි.මුළු ආදායමෙන් ජනතා බදු මුදල් වශයෙන් ලබාගන්නේ සියයට හතරක් පමණයි.අපගේ නායක ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ ගරු සභාපති ධම්මික නදීර බණ්ඩාර ජයසේකර මහතා විසින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැය ඉතා සාර්ථක අයවැයක් බව මම මෙහිදී ප්‍රකාශ කර සිටිනවා.කොරෝනා වසංගතය,ආර්ථික ගැටළුත් සමග වසර හතරක ඉතා දුෂ්කර කාලයක් අප පසු කළා.මේ කාලය තුළ ලබා දුන් සහයෝගය වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වන අතර 2023 වසර ඉතා සාර්ථක වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය

ගරු සභාපතිතුමනි,ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පක්ෂය ගැන පාක්ෂිකයන් ගැන නොව පොදුවේ රට ගැන සිතන නායකයෙක් බව ප්‍රකාශ කිරීම පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආනන්ද කුලතිලක මන්ත්‍රීතුමාට මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා.රටක නායකයෙක් වශයෙන් කුමන පක්ෂයකින් බලයට පැමිණියත් සියලු ම ජනතාවට පොදුවේ පක්ෂ ,ජාති,ආගම් භේදයකින් තොරව සැළකිය යුතුයි.මම 2002 සිට නායකතුමා සමග වැඩකටයුතු කරන පුද්ගලයෙක් වශයෙන් එතුමා සමග සිටීමට හේතුව වන්නේ එතුමාගේ ප්‍රතිපත්තිගරුක බව සහ රට ,ජනතාව යන පොදු අරමුණෙහි සිට වැඩ කිරීමයි.රට මේ තත්ත්වයට පත්වීමට හේතු වූයේ ජනතාව ඉඩම් කැබැල්ලට.සමෘද්ධියට,රැකියාවට දේශපාලකයන් පසුපස යාමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය

ගරු සභාපතිතුමනි,මේ අයවැය ඉතා ම සතුටුදායකයි.ගරු සභාපතිතුමාගේ කාර්යශූරත්වය හේතුවෙන් අද විශාල මුදලක් ඉතිරි කරගැනීමට හැකිවී තිබෙනවා.එසේම ගල්පාය කොට්ඨාශය සංවර්ධන කටයුතු අඩුවෙන් ම සිදුවූ ප්‍රදේශයයි.නමුත් සභාවෙන් මට ලැබුණු ප්‍රතිපාදන වලින් විශාල වැඩ කොටසක් කිරීමට හැකියාව ලැබුණා.එම්.එස්.අලුත්ගමගේ මහතා සභාපතිව සිටි අවධියේ එතුමාට ලැබුණු රුපියල් හැටක ගමන් වියදම එකතු කර පරණ ගම්සභා පාර හැදුවත් එය දැන් රැක ගැනීමට නොහැකිවීම පිළිබඳ මම කණගාටු වෙනවා.ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා හොඳ දැක්මක් සහිත නායකයෙක්.එතුමා පැරදවීම මහනුවර දිස්ත්‍රික්කයටම සිදුවන ලොකු පාඩුවක් බව සඳහන් කළ යුතුයි.අවසාන වශයෙන් 2023 අයවැය සකස් කළ ගරු සභාපතිතුමා ,මන්ත්‍රී මණ්ඩලය සහ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයට මාගේ ස්තූතිය පිරිනමනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමිය,රටේ පැවති තත්ත්වය මත පාර සෑදීමේ කටයුතු කල් ගියත් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණා.ඉක්මණින් බැකෝලෝඩරය සහ මෝටර් ග්‍රේඩරය යොදවා මාර්ගය සකස් කර දීමට බලාපොරොත්තු වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි,සෑම වසරකම මෙන්ම මෙවරත් 2023 අයවැය ගරු සභාපතිතුමා,ලේකම්තුමිය,මන්ත්‍රීවරුන් සියලු දෙනා එකතු වී අයවැය රටේ පවතින ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගෙන සකස් කොට තිබෙනවා.කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ,ආකර්ශනීය සංචාරක ස්ථාන ප්‍රවර්ධනය ආදිය පිළිබඳ අවධානය යොමු කර සභාවට ආදායම් උත්පාදනය කරන මාර්ග පිළිබඳ අවධානය යොමුකර වියදම් සීමා කරමින් සකස් කරන ලද අයවැයක් ලෙස දැක්විය හැකියි.ඉතාම අපහසු කාලපරිච්ඡේදයක ජීවත්වන බැවින් ජනතාව වෙත විශාල බදු බරක් පැටවිය නොහැකියි.නමුත් යම් ගාස්තුවක් වැඩි කර ඇත්තේමිළ ඉහළ යෑම් මත මේවා පවත්වාගෙන යාම සඳහා පමණයි.මුදලේ අගය දෙස බැලීමේදී එකල ඩොලරය රුපියල් හැටක් පමණ වුණු බැවින් 90 දශකයේ රුපියල් විසිපන් දහසක් යනු විශාල මුදලක් වුවත් වර්තමානයේ ලක්ෂ විස්සකින් විශාල වැඩ කොටසක් කිරීමේ හැකියාවක් නැහැ.ප්‍රාදේශීය සභාව පවතින තත්ත්වය මත එවන් මුදලක් වෙන් කිරීමට හැකිවීම පිළිබඳ ගරු සභාපතිතුමාට මාගේ ස්තූතිය ප්‍රකාශ කරනවා.ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා අප අසළින් සිට අප මෙහෙයවමින් නියාමනය කිරීම නිසා සභාවක් වශයෙන් අපට දුර ගමනක් යන්නට හැකි වුණා.තීරණ ගැනීමේදී පසුපසින් හිඳ නියාමනය කළ නිසා අප කරන්නට සැළසුම් කළ කටයුතු ප්‍රමාදයකින් තොරව කරන්නට හැකියාව

ලැබුණා.මේ ප්‍රදේශයේ ආර්ථිකය ගොඩනගන වැඩපිළිවෙළක් අප ගොඩනැගිය යුතුයි.සියලු දෙනා එක්ව රට ගොඩනැගීමට කටයුතු කළයුතු බවත් ප්‍රකාශ කරමින් 2023 අයවැය සඳහා මාගේ ප්‍රසාදය පළ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජකුමාර් විදුෂණී මහත්මිය

ගරු සභාපතිතුමනි,මේ අයවැය දමිළ භාෂාවට පරිවර්තනය කර තිබෙනවා.දමිළ මන්ත්‍රීවරියක් ලෙස මා පමණක් සිටින නිසා එය දමිළ භාෂාවට පරිවර්තනය නොකර සිටින්නට ඉඩ තිබුණු නමුත් එසේ නොකර දමිළ භාෂාවට පරිවර්තනය කිරීම මට විශාල උපකාරයක් වූ නිසා එයට ස්තූතිවන්ත වෙනවා. මේ අයවැයෙන් වතුජනතාවටත් සහන සළසනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.මේ අයවැයට මාගේ සහය ලබාදෙනවා.

ගරු සභාපතිතුමා

අදහස් දැක්වූ සියලුදෙනාට ස්තූතියි.වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.එම නිසා 2023 වර්ෂය සඳහා සකස් කළ අයවැය සම්මත කර ගැනීම සඳහා ඡන්ද විමසීම ආරම්භ කරමු.

2023 වර්ෂය සඳහා සැකසූ අයවැයට පක්ෂව ඡන්දය ලබාදීම ආරම්භ කරන්න. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

| | | |
|---|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති | - පක්ෂයි |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - පක්ෂයි |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 13. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 14. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 15. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 16. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 17.එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 18 ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 19 එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 20 රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |

21එන්.එම්. නන්දාවතී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පක්ෂයි

22ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පක්ෂයි

2023 වර්ෂය සඳහා සැකසූ අයවැය සඳහා විපක්ෂව ඡන්දය ලබා දීම ආරම්භ කරන්න. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

01.එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - විපක්ෂයි

ගරු සභාපතිතුමා

ඡන්ද විමසීම අනුව 2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව ඡන්ද 22 ක්ද විපක්ෂව ඡන්ද 01 ක්ද ලබාගෙන ඇත. ඒ අනුව, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පත වැඩි ඡන්ද 21 කින් සභා සම්මත වූ බව මා ගරු මහා සභාවට ප්‍රකාශ කරනවා. ඡන්දය ලබාදුන් සියලු දෙනාට මාගේ ස්තූතිය පුදකරනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය අනුමත කිරීම සුදුසු බවට තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති පී.ඕ.පී.ඩී.නදීර බණ්ඩාර ජයසේකර මහතාගේ 2023 වර්ෂයේ අයවැය පණිවිඩය

ආයුබෝවන්!

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපති මහින්දරත්න අලුත්ගමගේ මැතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි ,ගරු මන්ත්‍රීතුමියනි , ලේකම්තුමියනි , නිලධාරී මහත්ම මහත්මියනි ,එමෙන්ම ජන මාධ්‍ය ඇතුලු අනෙකුත් සියලු දෙනාගෙන්ම අවසරයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම උපයෝගී කරගෙන එම දැක්මට අනුගත වෙමින් මෙම බල ප්‍රදේශය තුල ජීවත්වන ජනතාවගේ ප්‍රශ්න හා ගැටළු හඳුනා ගනිමින් ගඟ ඉහළ කෝරළේ බල ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා , ජල සේවා , මංමාවත් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කළ අතර මේ වන විට රටෙහි උද්ගත වී ඇති තත්වය හමුවේ වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ රජයට සහයෝගය ලබා දෙමින් බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා අවශ්‍ය කටයුතු සිදු කිරීම මෙම සභාවේ ප්‍රධාන අරමුණු වේ.

ඒ අනුව පවත්නා රජයේ ප්‍රතිපත්ති වලට අනුගත වෙමින් සහ සභාවේ දැක්ම හා මෙහෙවරද ද මූලික කර ගනිමින් 2023 වර්ෂය සඳහා වඩාත් ඵලදායි තාත්ත්වික ජනතා හිතකාමී අයවැය ලේඛනයක් සකස් කර තිබෙනවා. ඒ අනුව මෙම බල ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට උපරිම උත්සාහයක් දරා , ඒ මගින් ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය පහසුකම් සපයා දීමට පෙර වර්ෂවල මෙන්ම 2023 වර්ෂයේද හැකියාව තිබෙන බව මම මතක් කර සිටිනවා. ඒ වගේම මාගේ සිවු වසරක ධූර කාලයට අමතරව පළාත් පාලන මැතිවරණය වසරකින් දීර්ඝ කිරීමත් සමග තවත් වසරක් සඳහා සාර්ථක අයවැයක් ඉදිරිපත් කිරීමට හැකිවීම මාගේ මෙන්ම ඔබ සැමගේද, බල ප්‍රදේශයේ ජනතාවගේද ජයග්‍රහණයක් බව සතුටින් ප්‍රකාශ කර සිටිනවා.

ඒ වගේම අපගේ මෙම ගෙවීගිය පාලන කාලය තුළ අභියෝග රැසකට මුහුණ පෑමට සිදු වූ බව ඔබත් මමත් හොඳින් දන්නා කරුණක්. කොවිඩ් වසංගත රෝගයට අමතරව රට මුහුණ දුන් ආර්ථික අර්බුධය හමුවේ සභාවක් වශයෙන් අපටද එය තදින්ම බලපෑ බවත් , ඒ හේතුවෙන් ඉලක්ක කරගත් අරමුණු රාශියක් සාක්ෂාත් කර ගැනීම අප වෙත තිබූ විශාලතම අභියෝගය වුවද එයටද සාර්ථකව මුහුණ දීමට හැකිවීම ද අප ලබා ගත් විශාල ජයග්‍රහණයක් බව මා නිහතමානීව මතක් කර සිටිනවා.

කෙතරම් බාධක තිබුණද 2022 වර්ෂයේ ප්‍රදේශයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට සභා අරමුදලින් එක් කොට්ඨාශයකට රු:1,500,000.00ක් බැගින් රු:19,500,000.00 ක ප්‍රතිපාදන ලබාගෙන බල ප්‍රදේශයේ යටිතල

පහසුකම් හා සංවර්ධන ක්‍රියාදාමයන් වැඩි දියුණු කිරීමට හැකිවීම ද අපි අත්පත් කරගත් තවත් ජයග්‍රහණයක් ලෙස සතුටින් ප්‍රකාශ කරනවා.

එසේම මෙම ප්‍රදේශයේ සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහි කිරීම මාගේ ප්‍රධානතම අරමුණක් වී තිබෙනවා. ඒ අරමුණ මුල් කර ගනිමින් ප්‍රදේශයේ කසළ ජනනය අවම කිරීමට හා විධිමත් කිරීමට ගත් සාර්ථකම අඩිතාලමක් ලෙස උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය හඳුන්වන්න පුළුවන්. පෙර පැවති රජයේ මෙන්ම වත්මන් රජයේද ප්‍රධාන ඉලක්කයක් වන කසළ අවම කර කාබනික පොහොර නිෂ්පාදනයටද මෙම ව්‍යාපෘතිය විශාල අත්වැලක් වන බව මාගේ විශ්වාසයයි. 2022 අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය මගින්ද මා කසළ අවම කිරීම කාර්යය සාධක දර්ශකයක් ලෙස ඉදිරිපත් කර සිටියා. වර්තමානය වන විට අප විසින් ආරම්භ කළ මෙම කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉතාම ඉහළ මට්ටමක පවතින බවත්, සෞඛ්‍යාරක්ෂිත භාවය මෙන්ම මේ වන විට සභාවේ ආදායම් මාර්ග වලින් ප්‍රමුඛතම ආදායම් මාර්ගයන් අතරට පත්වීමටත් මෙම ව්‍යාපෘතිය මගින් හැකි වී තිබෙන බව මා ඉතා සතුටින් ප්‍රකාශ කර සිටිනවා. 2023 වර්ෂයේදී දිරණ සහ නොදිරණ කසළ එකතුකිරීම මගින් රු.3,000,000.00 ක පමණ ආදායමක් අපේක්ෂා කර ඇස්තමේන්තුගත කිරීම මගින් සභාවේ ආදායම් තත්ත්වය ඉහළ නංවාගැනීමට හැකිවීම තුළින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා එය යොදවා ගැනීමට දායක වූ බව ද සතුටින් ප්‍රකාශ කර සිටිනවා.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති වශයෙන් තේරී පත්ව ධූර කාලයේ අවසන් වර්ෂය වෙනුවෙන් 2023 වර්ෂයට ද 05 වන වරටත් සාර්ථක අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි. ඒ අනුව 2023 වර්ෂය වෙනුවෙන් සකස් කර ඇති අයවැය මගින් සෑම කොට්ඨාසයකට රු:2,000,000.00 ක් බැගින් රු:26,000,000.00 වෙන්කර ඇත. එය මෙම ප්‍රාදේශීය සභා ඉතිහාසයේ ප්‍රථම වරට මේ සා විශාල මුදලක් වෙන්කල අවස්ථාව බැවින් ඒ පිළිබඳව මා ඉමහත් සතුටට පත්වනවා. අප ලද මෙම ජයග්‍රහනයට ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා සෑම අවස්ථාවකම උපදෙස් ලබාදෙමින් ධෛර්යමත් කරවමින් ඉදිරි කටයුතු සාර්ථක කරගැනීමට අප වෙත දැක්වූ සහයෝගය විශාල පන්නරයක් වූ බව මහත් අභිමානයෙන් ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම මීට පෙර මෙම සභාවේ නව ආදායම් මාර්ග ඇති කර සභාවේ ආර්ථික තත්වය ඉහළ නැංවීමට කටයුතු කළ හිටපු ගරු සභාපතිවරුන් දෙපළක් වන මහින්දරත්න අලුත්ගමගේ මැතිතුමා සහ ගුණරත්න රාජපක්ෂ මැතිතුමාද මෙම අවස්ථාවේ කෘතඥ පූර්වකව සිහිපත් කරනවා. පසුගිය වර්ෂවලදී අප කළ හා ඉදිරි වර්ෂයේදී කිරීමට යෝජිත කාර්යයන් කිහිපයක් ලෙස ,

- දිළිඳුභාවය අවම කිරීමට හා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා දායක වෙමින් කාන්තා අභිවෘද්ධි පුහුණු පාඨමාලා පැවැත්වීම
- පාසැල් ළමුන් , රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන් තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වීමට පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම හා එය **NVQ** මට්ටමට දියුණු කිරීම
- බල ප්‍රදේශයේ ජනතාවගේ ජල ගැටළු විසඳීම සඳහා ප්‍රජා ජල ව්‍යාපෘති සවිබල ගැන්වීම
- සෑම කොට්ඨාශයක්ම ආවරණ වන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- මාර්ග මැන ගැසට් කිරීම
- සුසානභූමි මැන නිරවුල් කිරීම
- නිදහස් ආයුර්වේදයේ ඔසු උයනක් පවත්වාගෙන යාම හා ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ඵලදායිතා තත්ත්ව කව ක්‍රියාකාරකම් තුලින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- වීථි පහන් ආලෝකකරණය විධිමත් කිරීම
- හරිත නගර සංවර්ධනය යටතේ පොදු වැසිකිළි පද්ධති සංවර්ධනය කිරීම , රුක් රෝපණය හා පාරිසරික සුන්දරත්වය රැකගැනීමට කටයුතු කිරීම (පෝස්ටර්, බැනර් ඉවත්කිරීම පාසැල් මට්ටමින් බෝ වන රෝග පිළිබඳව හා කසළ කළමනාකරණය හා පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය සුභ සාධන කටයුතු ක්‍රියාත්මක කිරීම

- ඇත්ගාල උප කාර්යාලය සතියේ සෑම දිනකම විවෘත කර තැබීම තුළින් ආයතනික සේවා සේවාලාභීන් වෙත ගෙනයාම හා හිඟ ආදායම් අයකර සභාවේ ආදායම් ඉහළ නැංවීමට හැකිවීම

- ඇත්ගාල නව පුස්තකාලය ආරම්භ කිරීම තුලින් පුස්තකාල සේවා ව්‍යාප්ත කිරීම

- සමෘද්ධි කඩ කාමර ඉවත්කර අංග සම්පූර්ණ වෙළඳ කුටි ඉදිකිරීම

- සංවර්ධන කටයුතු සඳහා වෙනත් මූලාශ්‍ර මගින් ප්‍රතිපාදන සළසාගෙන ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම

- ස්වභාවික ආපදාවන්වලදී ක්ෂණිකව ක්‍රියාත්මක වීම

- මාරාන්තික කොවිඩ් වසංගතයෙන් ජනතාව මුදාගැනීම පිණිස කොවිඩ් මර්දන කමිටු පත්කිරීමත් , සෑම නගරයකම විෂබීජහරණය කිරීමටත් ,එන්නත්කරණය, මහජනතාව ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමෙන් අත් පත්‍රිකා ලබාදෙමින් වසංගත රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට කටයුතු කිරීම

ආදිය පෙන්වා දෙමි. ඒ වගේම සභාවේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් ලෙස,

- අසුපිණිඇල්ල සංචාරක ආකර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීම

- කුරුඳුවත්ත සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

- උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය

ලෙස පෙන්වා දිය හැකියි. ඒ අනුව සභාවේ ආදායම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව කුරුඳුවත්ත නගරයේ සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට මූලික කටයුතු සිදු කර තිබෙනවා. ඒ සඳහා 2022 අයවැය මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රුපියල් කෝටි 03ක මුදලක් ණය වශයෙන් ලබාගැනීමටත් සභා අරමුදලින් එක්කෝටි විසිපන්ලක්ෂයක්ද යොදා පළමු අදියර ලෙස බිම් මහළ සහ පළමු මහළ සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට සැළසුම් කර තිබුණා. නමුත් රටෙහි පැවති තත්වය හා විවිධ බාධක හමුවේ අපට කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ කටයුතු අවසන් කිරීමට හැකියාවක් ලැබුණේ නැති නිසා 2023 වර්ෂයේ පළමු කාර්තුව අවසානයේදී කටයුතු අවසන් කර අදාළ කටයුතු සඳහා විවෘත කිරීමට හැකි වේ යැයි බලාපොරොත්තු වෙනවා.ඒ වගේම අසුපිණිඇල්ල සංචාරකයින්ගේ ආකර්ශණීය ස්ථානයක් ලෙස පරිවර්ථනය කිරීමට සියලුම කාර්යයන් සැළසුම් කර ආරම්භ කර තිබෙනවා. එමගින් ජනතාවගේ ආදායම් තත්ත්වය මෙන්ම සභාවේ ආදායම් තත්ත්වයද වර්ධනය කිරීමට ද මෙමගින් හැකිවන බව මහත් අභිමානයෙන් ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම මැදගොඩ හන්දිය නව නගරය ඉදිකිරීමේ මූලික කටයුතු ද සිදුකරමින් පවතින අතර එයද අවසන් වූ පසු ගරු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ උපදෙස් අනුව දොළොස්බාගේ නව නගරය ඉදිකිරීමේ කටයුතු ද ආරම්භ කිරීමට අදහස් කරගෙන තිබේනවා. මෙම සියලු ව්‍යාපෘති සභාවේ දිගුකාලීන ආදායම් ප්‍රභවයන් ලෙස හඳුන්වන්න පුලුවන්.

කෙතරම් අභියෝග වලට මුහුණ දෙමින් වුවද කාර්යාලීය වශයෙන් විවිධ ජයග්‍රහණයන් අත්පත් කර ගත් බවත් ඒ අතර ජාතික ඵලදායිතා තරඟාවලියේ සමස්ථ දිවයිනෙන්ම තුන්වන ස්ථානය හිමි කර ගැනීමටත්,වරලත් ගණකාධිකරණ ආයතනය මඟින් සංවිධානය කරනු ලැබූ හොඳම මූල්‍ය ප්‍රකාශන තෝරාගැනීමේ තරඟාවලියෙන්ද මහනුවර දිස්ත්‍රික්කයේ සම්මානයට භාජනය වූ එකම සභාව බවට පත්වීම හා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා විගණන මතය ලබා ගැනීමට හැකි වූ බවද අභිමානයෙන් යුතුව නිහතමානීව ප්‍රකාශ කර සිටිනවා. ඒ සඳහා ද මහත් කැපවීමෙන් කටයුතු කළ සභාවේ නිලධාරීන්ට මාගේ ස්තූතිය මේ අවස්ථාවේදී පුදකර සිටිනවා.

මෙම අවස්ථාවේ ආර්ථික අපහසුතාවන්ගෙන් පීඩාවට ලක්ව සිටින මාගේ බල ප්‍රදේශයේ ජනතාව පිළිබඳව සිතමින් ජනතාව මතට විශාල බදු බරක් නොදී 2023 වර්ෂයේ තාත්ත්වික අයවැයක් සකස් කල බව මම ප්‍රකාශ කර සිටිනවා. ඒ අනුව පුනරාවර්ථන වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව අඩුකර බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා වැඩි මුදලක් වෙන්කිරීමට මම කටයුතු කර තිබෙනවා.ඒ වගේම මෙම අයවැය ඉලක්ක සියයට සියයක්ම සාර්ථක කරගැනීම සඳහා ක්‍රියාත්මක සැළැස්ම , දිගුකාලීන , කෙටිකාලීන හා මධ්‍ය කාලීන සැළසුම් සකස් කර ඇති අතර, එයට අනුගත වෙමින් කටයුතු කිරීම මාගේත් ඔබගේත් කාර්යය මණ්ඩයේත් වගකීමක් බව මම මෙහිදී ප්‍රකාශ කර සිටිනවා.

මෙසේ මෙම සභාවේ අප ලද සියලුම විජයග්‍රහණයන් වෙනුවෙන් මහගු කර්තව්‍යයන් ඉටුකිරීමෙහි උපදෙස් හා නන් අයුරින් සහයෝගය දැක් වූ ප්‍රධාන නියමුවා ලෙස ගරු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. එමෙන්ම මහනුවර දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු

මන්ත්‍රී ගරු ආනන්ද අලුත්ගමගේ මැතිතුමාටත් , මෙම සභාව වර්තමාන තත්ත්වය කරා ගෙන ඒමට මහත් වූ කැපකිරීම් කළ හිටපු ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන් වන මහින්දරත්න අලුත්ගමගේ මැතිතුමා සහ ආර්.පී.ගුණරත්න මැතිතුමාටත් එවකට සභාව නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමන්ලාටත් ගරු මන්ත්‍රීතුමියන්ලාටත් මාගේ හදපිරි ප්‍රණාමය පුද කර සිටිමි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව අඩු ආදායම් තත්ත්වයේ සභාවක් වන නමුත්, එම ආදායමෙන් මහජනතාවට උපරිම සේවාවක් ලබාදීමට මා අපේක්ෂා කරනවා. ඒ යන ගමන් මගෙහි මාගේ සහෝදර ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් ලැබෙන සහයෝගය මහත් ශක්තියක් වූ අතර , ඉදිරියේදීත් එම සහයෝගය ඒ ආකාරයෙන්ම ලැබේයැයි මා අපේක්ෂා කරනවා. තවද, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාටත් , මධ්‍යම පළාත් හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියළුම හිටපු පළාත් සභා ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත් , පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් මාගේ ගෞරවය මෙයින් පුද කරමි.

තවද පළාත් පාලන ආයතනවලට අවශ්‍ය උපදෙස් ,මග පෙන්වීම් හා සහයෝගය ලබාදෙමින් ජනතාවට එලදායි සේවාවක් ලබාදීමට සහාය දෙන මධ්‍යම පළාත් , පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් ,පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය ඇතුළු එම කාර්යය මණ්ඩලයටත් අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහයෝගය ලබාදුන් ප්‍රධානීන් හා නිලධාරීන්ටත් මාගේ ගෞරව ප්‍රණාමය පුද කරනවා.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මෙම තත්ත්වයට ගෙන ඒමට මා සමග නිරන්තරයෙන් සාකච්ඡා කර උපදෙස් ලබාදෙමින් මාගේ ඉලක්ක කරා ළඟා වීමට සහය ලබාදෙන ලේකම් ඩී.එම්.එල්.ඩී.දසනායක මහත්මිය, ප්‍රධාන කළමනාරණ සේවා නිලධාරී ටී.සී.පී.ද සිල්වා මහත්මිය ඇතුළු මාගේ කාර්යය මණ්ඩලයට සහ කණිෂ්ඨ සේවක මණ්ඩලයටත් මාගේ හදපිරි ප්‍රණාමය පුද කරනවා. එසේම 2023 වර්ෂයේ අයවැය සකස් කිරීමේ කාර්යය සිදු කළ ලක්මිණී පියනන්දන මහත්මියටත් එම නිලධාරිණිය නවක නිලධාරිණියක් බැවින් අයවැය සකස් කිරීමේ කාර්යයන් සිදු කිරීම සඳහා සියළුම ආකාරයෙන් එම නිලධාරිණියට සහයෝගය ලබා දුන් පෙර ගිණුම් විෂය භාරව කටයුතු කළ ස්ථානමාරුවීම් ලබාගිය ඩී.කේ.සුදර්ශනී කුමාරි මැණිකේ මෙනවියටත් මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

අවසාන වශයෙන් උදාවන 2023 නව වසර ඔබ සැමටත් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවටත් සමස්ත ශ්‍රී ලාංකික ජනතාවටත් නිදුක් නිරෝගී සාමය සතුට සපිරි සුභ නව වසරක් වේවායි! මම ප්‍රාර්ථනා කරමි.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ තාක්ෂණික කමිටුව සඳහා පහත නම් සඳහන් නිලධාරීන් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

1.වයි.එම්.සී.යාපා මිය - ඉංජිනේරු,ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

2.පී.ජී.සී.කුමාරි මිය - ගණකාධිකාරී,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

3.ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මයා - ජ්‍යේෂ්ඨ වැඩ අධිකාරී,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ තාක්ෂණික කමිටුව සඳහා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු- වයි.එම්.සී.යාපා මිය ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී- පී.ජී.සී.කුමාරි මිය,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ජ්‍යේෂ්ඨ වැඩ අධිකාරී ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මයා යන නිලධාරීන් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි,වැඩ අධිකාරී මහතා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටින නිසා ගැටළුවක් ඇතිවේද යන්න සොයා බැලීම සුදුසුය යන්න මගේ අදහසයි.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා,ඒ නිලධාරී මහතා පළාත් පාලන කොමසාරිස්තුමා විසින් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට බඳවා ගැනීම යටතේ යොමු කළ නිළධාරියෙක් වන බැවින් ගැටළුවක් නැහැ.නමුත් මේ සම්බන්ධයෙන් තවදුරටත් සොයාබලා කටයුතු කිරීමට පියවර ගන්නවා.ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මේ ව්‍යාපෘතිය පිලිබඳ සම්පූර්ණ වගකීම ගන්නා බවත් දන්වා තිබෙනවා.වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ තාක්ෂණික කමිටුව සඳහා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු- වයි.එම්.සී.යාපා මිය ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී- පී.පී.සී.කුමාරි මිය,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ජ්‍යේෂ්ඨ වැඩ අධිකාරී - ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මයා යන නිලධාරීන් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිතව සභා සම්මත විය.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ පළමු බිල්පත වන රු.1,799.282.82ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ පළමු බිල්පත වන රු.1,799.282.82ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙම මුදලින් සියයට විස්සක් පෙර ගෙවූ අත්තිකාරම් සඳහා අය කරගන්නවා.මෙම යෝජනාව පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,මේ සඳහා සභාවේ ස්ථාවර තැන්පතුවලින් රුපියල් කෝටි එකහමාරක් ගෙවා තිබෙනවා.එම මුදල් අපේ ස්ථාවර තැන්පතුවෙහි තවදුරටත් තිබුණේ නම් පොළී මුදලක් ඒ සඳහා සභාවට ලැබෙනවා.නමුත් කොන්ත්‍රාත්කරු දිගින් දිගටම මෙම ව්‍යාපෘතිය ප්‍රමාද කිරීම තුළ අපට අවාසියක් වන බව මගේ අදහසයි.එසේම කම්බිවල මිළ මෙන් ම එකක්තුන්දහස් හාරසියයට තිබුණු සිමෙන්ති මිටියක මිළ ද දැන් රුපියල් දෙදහස් හයසියයක් දක්වා අඩු වී තිබෙනවා.එම නිසා බිල දැමූ දවසේ සිට වැඩි වුණු රේට් එක ඉංජිනේරු සේවා දෙපාර්මේන්තුවෙන් ලබාගත යුතුය යන්න මගේ අදහසයි.භාණ්ඩ මිළ අඩුවූ පසු කර්මාන්තය නිම කිරීමෙන් මිළ විචලනය වීම නිසා වැඩිකළ සියයට දහය ලබාදීමේදී සභාවට පාඩුවක් සිදුවෙනවා.

ගරු සභාපතිතුමා

ව්‍යාපෘතිය නිම කිරීම සඳහා තවත් මාස හයක කාලයක් පමණක් ලබා ඇති නිසා තවදුරටත් ප්‍රමාද කිරීමේ හැකියාවක් කොන්ත්‍රාත්කරුට නොමැති බව මගේ අදහසයි.මාස 06ක කාලය ඉක්මවුවහොත් දඩ නියම කිරීමට සිදුවෙනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ පළමු බිල්පත වන රු.1,799.282.82ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිතව සභා සම්මත විය.

05:01:04-I ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:01 viii යටතේ මහ සභාවේ සම්මත වූ මාගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් යෝජනා කරමි.

දැනට සම්මත වී ඇති හා පරිච්ජින්න කළ යුතු යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ප්‍රකාශයටපත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 3(2) යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

නව යෝජනාව

"1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරණ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙන් වැළඳගෙන ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමක් වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

තීරණය

2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:01 viii යටතේ මහ සභාවේ සම්මත වූ යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යොජනාව ඒකමතිකව සභා සම්මත විය.

"1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරණ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙන් වැළදගෙන ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමක් වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

05:01:04 II ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:01 XI යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.

දැනට සම්මත වී ඇති හා පරිච්ජින්න කළ යුතු යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 06 යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

නව යෝජනාව

"1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරණ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙන් වැළදගෙන ඇති කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කුලී රථ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

තීරණය

2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:01 XI යටතේ මහ සභාවේ සම්මත වූ යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ජින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යොජනාව ඒකමතිකව සභා සම්මත විය.

සම්මත වූ නව යෝජනාව

"1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරණ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙන් වැළඳගෙන ඇති කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කුලී රථ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

## 06. යථා පරිදි කල්දී නොමැති යෝජනා /හදිසි යෝජනා - ඇත

### 06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාලිගාපුරණ වසමට අයත් ප්‍රදේශයක ගම්පොළ නගර සභාව විසින් මින් පෙර වරිපනම් බදු අය කරන ලද අතර සීමා නීර්ණය කර ගැනීමෙන් පසු ගම්පොළ නගර සභාව විසින් දැනට වරිපනම් අය කිරීම නවතා ඇත.අප ප්‍රාදේශීය සභාව මගින් නැවත එම දේපළ වලට අදාළව වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ලේඛනගත වී ඇති එකී දේපළ වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අවසන් වරට ලබා දී ඇති වාර්ෂික තක්සේරු වටිනාකම එලෙසින් ම පිළිගැනීමටත් ,ඒ අනුව ව්‍යාපාරික ස්ථාන වෙනුවෙන් වාර්ෂික වටිනාකම මත 10%ක සහ නේවාසික ස්ථාන වෙනුවෙන් 8%ක වරිපනම් බද්දක් ද නියම කොට පනවා අය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාලිගාපුරණ වසමට අයත් ප්‍රදේශයක ගම්පොළ නගර සභාව විසින් මින් පෙර වරිපනම් බදු අය කරන ලද අතර සීමා නීර්ණය කර ගැනීමෙන් පසු ගම්පොළ නගර සභාව විසින් දැනට වරිපනම් අය කිරීම නවතා තිබෙනවා.වසර ගණනාවකින් වරිපනම් අය කර නැති අතර හිඟ මුදලක්ද අය කර ගැනීමට තිබෙනවා.අපි එම ප්‍රදේශයෙන් කුණු ලබා ගන්නවා.වරිපනම් ගෙවීමටත් ඔවුන් එකඟයි.අප ප්‍රාදේශීය සභාව මගින් නැවත එම දේපළ වලට අදාළව වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ලේඛනගත වී ඇති එකී දේපළ වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අවසන් වරට ලබා දී ඇති වාර්ෂික තක්සේරු වටිනාකම එලෙසින් ම පිළිගැනීමටත් ,ඒ අනුව ව්‍යාපාරික ස්ථාන වෙනුවෙන් වාර්ෂික වටිනාකම මත 10%ක සහ නේවාසික ස්ථාන වෙනුවෙන් 8%ක වරිපනම් බද්දක් ද නියම කොට පනවා අය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.සභාවට වාසි සහගතවන ලෙස මෙම කාර්යය සිදු කිරීම පිළිබඳව ආදායම් පරීක්ෂකවරයා දැනුවත් කිරීම සුදුසුයි.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාලිගාපුරණ වසමට අයත් ප්‍රදේශයක ගම්පොළ නගර සභාව විසින් මින් පෙර වරිපනම් බදු අය කරන ලද අතර සීමා නීර්ණය කර ගැනීමෙන් පසු ගම්පොළ නගර සභාව විසින් දැනට වරිපනම් අය කිරීම නවතා ඇත.අප ප්‍රාදේශීය සභාව මගින් නැවත එම දේපළ වලට අදාළව වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ලේඛනගත වී ඇති එකී දේපළ වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව

මගින් අවසන් වරට ලබා දී ඇති වාර්ෂික තක්සේරු වටිනාකම එලෙසින් ම පිළිගැනීමටත් ,ඒ අනුව ව්‍යාපාරික ස්ථාන වෙනුවෙන් වාර්ෂික වටිනාකම මත 10%ක සහ නේවාසික ස්ථාන වෙනුවෙන් 8%ක වරිපනම් බද්දක් ද නියම කොට පනවා අය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ **CPC/ACLG/K/AM 04-11** සහ **2021/01/07** දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී පරිදි අදාළ සංශෝධනද ඇතුළත් කර පහත සඳහන් ප්‍රදේශ නව වරිපනම් බදු පැනවීමේ කාර්යය සඳහා දියුණු කළ ප්‍රාදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

01. ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට විගුලවත්ත හරහා නව විගුලවත්ත මාර්ගයේ පුද්ගලික බස් නැවතුම්පල පිටුපස කණාමැදිළි ඔය හරහා ඇති යකඩ පාලම දක්වා වූ මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට

02. ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට සාලියාවත්ත දක්වා දිවෙන මාර්ගයේ සාලියාවත්ත 03 වන පටුමග ෆාතිමා ෂහීරා මියගේ නිවස දක්වා මාර්ගය දෙපස මීටර් 300ක් දුරට

03. ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට ජයමාලපුර දක්වා දිවෙන මාර්ගයේ උඩුපිටිය හංදිය නසීර් බායි මහතාගේ පරණ යකඩ එකලස් කරන මධ්‍යස්ථානය දක්වා මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට

04. ගම්පොල සිට නාවලපිටිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ සමරකෝන් ඉන්ධන පිරවුම්හලට දකුණු පසින් ඇති මැනුවෙල් ශ්‍රීපාලි මයාගේ වාහන අමතර කොටස් වෙළඳසැල සිට නාවලපිටිය දෙසට ඇති සුජාතා ස්ටුඩියෝ වර්ණ රසායනාගාරය දක්වා මාර්ගය දෙපස මීටර් 600ක් දුරට

05. විගුලවත්ත ක්‍රීඩාපිටිය සිට මාළිගාපුරණ රජමහා විහාරය තෙක් දිවෙන මාර්ගයේ සරත් බණ්ඩාර පළිපාන මයාගේ නිවසේ සිට මාළිගාපුරණ රජමහා විහාරය දක්වා මාර්ගය දෙපස මීටර් 300ක් දුරට

06. පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට විජයාරාම විහාරස්ථානය දක්වා වන කොන්ක්‍රීට් මාර්ගයේ විජයාරාම විහාරස්ථානය තෙක් දෙපස මීටර් 300ක් දුරට

07. පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට කොස්ගොල්ල දක්වා වන අතුරු මාර්ගයේ කොස්ගොල්ල මාර්ගය මුණගැහෙන තුන්මංහන්දිය දක්වා එකී මාර්ගයේ දකුණු පස මීටර් 150ක් දුරට ( මාර්ගය වම්පස ගම්පොල නගර සභාවට අයත් සීමාව)

08. පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට ගොඩගම ගංගාතිලක රජමහා විහාරය පිටුපස මායිමෙහි ඇල මාර්ගය අසල අංක 221/4/45 පදිංචි සිව ඥානම් මයාගේ නිවස දක්වා වන මාර්ගය දෙපස මීටර් 300ක් වූ දුරට

09. පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුන්මංහන්දියේ තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට **M.G.M.P.** සේපාලිකා මියගේ නිවස දක්වා එම මාර්ගයේ වම්පස මීටර් 150ක් දුරට

10.ජයමාලපුර 06 වන පටුමග ජයම්පතී නිශ්ශංක ජයසුන්දර මයාගේ මල්පැල අළෙවිසැල සිට ගම්පොලවෙල දෙසට වන මාර්ගයේ උඩුපිටිය හංදියෙහි නසීර් බායි මයාගේ පරණ යකඩ එකලස් කරන මධ්‍යස්ථානය දක්වා වන මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ **CPC/ACLG/K/AM 04-11 සහ 2021/01/07** දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී පරිදි අදාළ සංශෝධනද ඇතුළත් කර පහත සඳහන් ප්‍රදේශ නව වරිපනම් බදු පැනවීමේ කාර්යය සඳහා දියුණු කළ ප්‍රාදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.ආදායම් පරීක්ෂකවරු දස දෙනෙක් මේ සඳහා සම්බන්ධ කරගෙන කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

තීරණය

නව වරිපනම් බදු පැනවීමේ කාර්යය සඳහා දියුණු කළ ප්‍රාදේශ වශයෙන් ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට වීගුලවත්ත හරහා නව වීගුලවත්ත මාර්ගයේ පුද්ගලික බස් නැවතුම්පල පිටුපස කණාමැදිළි ඔය හරහා ඇති යකඩ පාලම දක්වා වූ මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට ,ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට සාලියාවත්ත දක්වා දිවෙන මාර්ගයේ සාලියාවත්ත 03 වන පටුමග ෆාතිමා ෂහීරා මියගේ නිවස දක්වා මාර්ගය දෙපස මීටර් 300ක් දුරට,ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට ජයමාලපුර දක්වා දිවෙන මාර්ගයේ උඩුපිටිය හංදිය නසීර් බායි මහතාගේ පරණ යකඩ එකලස් කරන මධ්‍යස්ථානය දක්වා මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට ,ගම්පොල සිට නාවලපිටිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ සමරකෝන් ඉන්ධන පිරවුම්හලට දකුණු පසින් ඇති මැනුවෙල් ශ්‍රීපාලි මයාගේ වාහන අමතර කොටස් වෙළඳසැල සිට නාවලපිටිය දෙසට ඇති සුජාතා ස්ටුඩියෝ වර්ණ රසායනාගාරය දක්වා මාර්ගය දෙපස මීටර් 600ක් දුරට, වීගුලවත්ත ක්‍රීඩාපිටිය සිට මාළිගාපුරණ රජමහා විහාරය තෙක් දිවෙන මාර්ගයේ සරත් බණ්ඩාර පළිපාන මයාගේ නිවසේ සිට මාළිගාපුරණ රජමහා විහාරය දක්වා මාර්ගය දෙපස මීටර් 300ක් දුරට ,පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට විජයාරාම විහාරස්ථානය දක්වා වන කොන්ක්‍රීට් මාර්ගයේ විජයාරාම විහාරස්ථානය තෙක් දෙපස මීටර් 300ක් දුරට ,පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට කොස්ගොල්ල දක්වා වන අතුරු මාර්ගයේ කොස්ගොල්ල මාර්ගය මුණගැහෙන තුන්මංහන්දිය දක්වා එකී මාර්ගයේ දකුණු පස මීටර් 150ක් දුරට ( මාර්ගය වම්පස ගම්පොල නගර සභාවට අයත් සීමාව),පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට ගොඩගම ගංගාතිලක රජමහා විහාරය පිටුපස මායිමෙහි ඇල මාර්ගය අසල අංක 221/4/45 පදිංචි සිව ඥානම් මයාගේ නිවස දක්වා වන මාර්ගය දෙපස මීටර් 300ක් වූ දුරට ද පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුන්මංහන්දියේ තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට **M.G.M.P.** සේපාලිකා මියගේ නිවස දක්වා එම මාර්ගයේ වම්පස මීටර් 150ක් දුරට ද ජයමාලපුර 06 වන පටුමග ජයම්පතී නිශ්ශංක ජයසුන්දර මයාගේ මල්පැල අළෙවිසැල සිට ගම්පොලවෙල දෙසට වන මාර්ගයේ උඩුපිටිය හංදියෙහි නසීර් බායි මයාගේ පරණ යකඩ එකලස් කරන මධ්‍යස්ථානය දක්වා වන මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට යන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යොජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලය මගින් කොත්මලේ වහරු අංගනය ආසන්නයේ සිට නව පොල්පිටිය ග්‍රිඩ් උපපොල දක්වා ද.වො.220 සහ ද.වො.132 -3 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේදී උලපනාවත්ත මාර්ගයට හානි සිදුවීම හේතුවෙන් එම මාර්ගය පිළිසකර කර දෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට දන්වන ලද අතර එම කාර්යය ප්‍රමාදවීම හේතුවෙන් පසුව සභාව මගින් එම කාර්යය සිදුකරන ලෙසත් ඒ සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙසත් ලංකා විදුලිබල මණ්ඩලය මගින් දන්වන ලදී. ඒ අනුව රු.8,759,364.85ක ඇස්තමේන්තුවක් සභාව විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර උලපනේවත්ත පාර බැම්ම ඉදිකර මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා අදාළ රු.8,759,364.85ක ඇස්තමේන්තු මුදල අදියර 05ක් යටතේ සභාවට ගෙවීමට එකඟතාවයකට එළැඹීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීමටත් අදියර 05ක් යටතේ ප්‍රතිපාදන ලබාදෙන බැවින් එම ව්‍යාපෘතිය සඳහා උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන /සුභසාධක සමිතිය සමග ගිවිසුම්ගතවීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ලංකා විදුලිබල මණ්ඩලය මගින් කොත්මලේ වහරු අංගනය ආසන්නයේ සිට නව පොල්පිටිය ග්‍රිඩ් උපපොල දක්වා ද.වෝ.220 සහ ද.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේදී උලපනාවත්ත මාර්ගයට හානි සිදුවීම හේතුවෙන් එම මාර්ගය පිළිසකර කර දෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට දන්වන ලද අතර රට තුළ පැවති ආර්ථික ගැටලු හා ඉන්ධන හිඟය හේතුවෙන් මාර්ගය පිළිසකර කිරීම ප්‍රමාද වු බැවින් සභාව මගින් එම මාර්ගය පිළිසකර කිරීමටත් ඒ සඳහා ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය මගින් දැරීමටත් එකඟත්වයකට පැමිණියා. ඒ අනුව රු.8,759,364.85ක ඇස්තමේන්තුවක් සභාව විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ඉදිරිපත් කළා.ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලය අදාළ ප්‍රතිපාදන මුදල අදියර 05ක් යටතේ ගෙවීමට කැමැත්ත පළ කළ අතර ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීමටත් අදියර වශයෙන් ප්‍රතිපාදන ලබාදෙන බැවින් උලපනේවත්ත පාර බැම්ම ඉදිකර මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා බල ප්‍රදේශයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කාර සමිතියක් වන උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන /සුභසාධක සමිතිය සමග ගිවිසුම්ගතවීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

උලපනේවත්ත පාර බැම්ම ඉදිකර මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා අදාළ ඇස්තමේන්තු මුදල වන රු.8,759,364.85ක මුදල අදියර 05ක් යටතේ සභාවට ගෙවීමට ලංකා විදුලිබල මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීමටත් අදියර පහක් යටතේ ප්‍රතිපාදන ලබාදෙන බැවින් එම ව්‍යාපෘතිය සඳහා උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන /සුභසාධක සමිතිය සමග ගිවිසුම්ගතවීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යොජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 2022.11.09 වන දින මහා සභා රැස්වීම් තීරණ උධෘත ලබා දීම

දිනය :- 2022.11.09

තීරණ අංකය :- 06:04:

06:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ස්ථාවර තැන්පතු ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| ගිණුම් අංකය | වටිනාකම |
|---|---|
| 2- 0074-10-53329 | රු.3,000,000.00 |
| 2-0074-10-82442 | රු.1,000,000.00 |

ගරු සභාපතිතුමා

සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ස්ථාවර තැන්පතු ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

මා විසින් එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

**සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.10,000,000.00ක ස්ථාවර තැන්පතු ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**07 කාරක සභා වාර්තා සළකා බැලීම - නැත**

**08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව**

**2022.10.10 සිට 2022.11. 01 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදී.**

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර් අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2022-10-17 | රෙජිස්ටාර් ජනරාල් - ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය - ගම්පොළ. | ගම්පොළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ 2021 ජූලි මස මුද්දර ගාස්තු ලැබී ඇති බැවින් ඊට අදාළ කාර්යාල දීමනා ගෙවීම. | 1141 | | 6,400.00 |
| 2 | | සමගි ප්‍රජා මූල සංවිධානය - තැලිහුන්න පාසල අසළ - කුරුදුවත්ත කඩවීදිය. | කුරුදුවත්ත මහජන පුස්තකාලයට 2022 සැප්තැම්බර් මස ජලය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1142 | | 120.00 |
| 3 | 2022-10-17 | එන්.ජී.එස්.එස් සෝමතිලක මයා - රියදුරු | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම. | 1143 | | 11,195.00 |
| 4 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කාර්යාල ලිපි තැපැල් කිරීමට අවශ්‍ය මුද්දර ලබා ගැනීම. | 1144 | | 10,000.00 |
| 5 | | ඩබ්.ජේ.පී ගුණරත්න මයා. - ආදායම් පරීක්ෂක | 2022 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම | 1145 | | 3,354.00 |
| 6 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝබර් මස මන්ත්‍රී දීමනා,ඉන්ධන දීමනා,දුරකථන දීමනා ගෙවීම. | 1146 | | 419,350.00 |
| 7 | | කලමණාකරු - ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාව ගිණුම් අංක 0079868709 | පොදුජන පෙරමුණ පක්ෂ අරමුදලට ගෙවීම | 1147 | | 12,000.00 |
| 8 | | භාණ්ඩාගාරික ශ්‍රී ලංකා නිදහස් පක්ෂය | ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අරමුදලට ගෙවීම | | | 150.00 |
| 9 | | කලමණාකරු - ජාතික ඉතිරි කිරීමේ බැංකුව ගිණුම් අංක 10074394815 | ගරු මන්ත්‍රී ආනන්ද කුලතිලක මහතාගේ මාසික දීමනාව ගෙවීම | | | 16,500.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | | කලමණාකරු - මහජන බැංකුව ගිණුම් අංක 257200160055780 | ගරු මන්ත්‍රී එම්.පී අබේරත්න බණ්ඩාර මහතාගේ මාසික දීමනාව මහනුවර දිස්ත්‍රික් පළාත් පාලන මන්ත්‍රී වැටුප් අරමුදලට ගෙවීම | | | 40,500.00 |
| 11 | | භාණ්ඩාගාරික එක්සත් ජාතික පක්ෂය | එක්සත් ජාතික පක්ෂ අරමුදලට ගෙවීම | | | 6,000.00 |
| 12 | 2022-10-18 | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මහනුවර. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය - මහනුවර. | කුරුදුවත්ත වෙළඳ සංකීර්ණ ඉඩමෙහි මු.පි. මහ 1654 කැබලි අංක 1.2.3 සහ 4 පිඹුර හා ඉඩම් විස්තර ලැයිස්තු පිටපත් ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම. | 1148 | | 3,450.00 |
| 13 | | එම්.පී දර්ශන බංඩාර ධර්මරත්න මයා. අනුහස් හොටෙල් ඇන්ඩ් කේටරින් ,දොළොස්බාගේ පාර, කුරුදුවත්ත. | 2022.09.20 දින පැවති මහ සභාවට වතුර බෝතල් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1149 | | 1,680.00 |
| 14 | | CHIEF ENGINEERING,A/16 ALUDENIYA,HEMMATHAGAMA | පළාත් පාලන ප්‍රජා ජල සම්පාදන වැඩසටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රිධරන්පුර ජල යෝජනා ක්‍රමයේ මුදල් ගෙවීම. | 1150 | | 2,521,271.43 |
| 15 | 2022-10-19 | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | කුරුදුවත්ත ජල පොම්පාගාරයේ 2022 සැප්තැම්බර් මස විදුලි බිල්පත ගෙවීම. | 1151 | | 9,596.00 |
| 16 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | උළපනේ ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ 2022 සැප්තැම්බර් මස විදුලි බිල්පත ගෙවීම. | 1152 | | 1,060.00 |
| 17 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම. | 1153 | | 13,244.00 |
| 18 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | උළපනේ කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම. | 1154 | | 2,660.00 |
| 19 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | ප්‍රධාන කාර්යාලීය දුරකථනයේ 2022 සැප්තැම්බර් මස දුරකථන බිල්පත ගෙවීම. | 1155 | | 13,444.82 |
| 20 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | ඊ නැණ පියස දුරකථනයේ 2022 සැප්තැම්බර් මස දුරකථන බිල්පත ගෙවීම. | 1156 | | 677.91 |
| 21 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකථනයේ 2022 සැප්තැම්බර් මස දුරකථන බිල්පත ගෙවීම. | 1157 | | 1,601.42 |
| 22 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | ඇත්ගාල උපකාර්යාලීය දුරකථනයේ 2022 සැප්තැම්බර් මස දුරකථන බිල්පත ගෙවීම. | 1158 | | 3,359.13 |
| 23 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | ගරු උප සභාපතිතුමාගේ කාර්යාලීය දුරකථනයේ 2022 සැප්තැම්බර් මස දුරකථන බිල්පත ගෙවීම. | 1159 | | 1,381.23 |
| 24 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | කුරුදුවත්ත මහජන පුස්තකාලයේ 2022 සැප්තැම්බර් මස දුරකථන බිල්පත ගෙවීම. | 1160 | | 1,952.04 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 25 | 2022-11-19 | සී/ස ගඟඉහළ කෝරලේ විවිධ සේවා සමුපාකාර සමිතිය.කුරුදුවත්ත කඩ වීදිය. | සී/ස ගඟඉහළ කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතියේ ඉන්ධන පිරවුම්හලෙන් ණය පදනම මත ලබා දී ඇති ඉන්ධන සඳහා මුදල් ගෙවීම. ( 2022.09.16 සිට 2022.09.30 දක්වා ) | 1161 | | 169,037.40 |
| 26 | | ලේකම් ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | උලපනේ සුධර්මා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයෙහි ළමුන් හා අවට පෙර පාසල් ළමුන් සඳහා2022.10.21 දින පැවැත්වීමට නියමිත  කසළ කළමණාකරනය හා ඩෙංගු පාලනය පිළිබඳ වැඩසටහන වෙනුවෙන් සංග්‍රහ කටයුතු සඳහා මුදල් ලබා ගැනීම. | 1162 | | 5,000.00 |
| 27 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ  ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝබර් මස සේවක වැටුප් ගෙවීම | 1163 | | 2,967,492.47 |
| 28 | 2022-10-25 | පී කවිදර්ශනා මිය. - | 2022 ජූනි සහ ජූලි මාසවලට  අදාළ මහ සභා රැස්වීම් වාර්තා දමිළ භාෂාවට පරිවර්ථනය කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 1164 | | 20,000.00 |
| 29 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | 2022 වර්ෂයේ සැප්තැම්බර්  මස නිලධාරීන් සඳහා  ලිපි ද්‍රව්‍ය  නිකුත් කිරීම ගිණුම්ගත කිරීම. | 1165 | | 94,399.51 |
| 30 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | 2022 වර්ෂයේ සැප්තැම්බර්  මස  පොදු ගබඩා ද්‍රව්‍ය නිකුත් කිරීම ගිණුම්ගත කිරීම. | 1166 | | 197,504.00 |
| 31 | | සමගි ප්‍රජා මුල සංවිධානය - තැලිහුන්න පාසල අසළ - කුරුදුවත්ත කඩවීදිය. | කුරුදුවත්ත ප්‍රාදේශීය සභා ක්‍රීඩාගාරයේ අගෝස්තු,සැප්තැම්බර් මස ජල බිල්පත් ගෙවීම. | 1167 | | 5,900.00 |
| 32 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය. | ඇත්ගාල ක්‍රීඩාගාරයේ  2022 සැප්තැම්බර් මස ජල බිල ගෙවීම. | 1168 | | 3,765.48 |
| 33 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය. | ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ 2022 අගෝස්තු මස ජල බිල ගෙවීම. | 1169 | | 816.50 |
| 34 | | ලේකම් ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | ඇත්ගාල උප කාර්යාලයේ  ලිපි තැපැල් කිරීමට අවශ්‍ය මුද්දර මිළට ගැනීම. | 1170 | | 5,000.00 |
| 35 | | ඩබ්.ජනජීව  - සංවර්ධන නිලධාරී | CP-ZA  5189 බැකෝ යන්ත්‍රයේ යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීම සඳහා නාවලපිටිය ඩිපෝව වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1171 | | 572.90 |
| 36 | | කේ.ජී.ඩී.එස්.කේ. වික්‍රමරත්න මිය - සංවර්ධන නිලධාරී | 2022.09.18 දින පල්ලෙකැලේ කලමණාකරන පුහුණු ආයතනයේ පැවති The Function  of Microsoft Excel වැඩසටහන සඳහා සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1172 | | 1,372.00 |
| 37 | | අයි.ජී.පුෂ්පලාල් ඉහළවෙල මයා - කාර්යාල කාර්ය සහයක. | 2022.09.20 දින පල්ලෙකැලේ කලමණාකරන පුහුණු ආයතනයේ පැවති  Basic Computer Skills වැඩසටහන සඳහා සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1173 | | 1,352.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 38 | 2022-10-26 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | ගඟ ඉහළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පැවති මාපිය සැසි සඳහා මුදල් ගෙවීම. | 1174 | | 17,645.00 |
| 39 | | කේ.ජී.ඩී.එස්.කේ. වික්‍රමරත්න මිය - සංවර්ධන නිලධාරී | නිවස අළුත්වැඩියා කිරීම සඳහා ආපදා ණය මුදල් ලබා දීම. | 1175 | 25.00 | 249,975.00 |
| 40 | | ප්‍රිය ස්ටෝර්ස් - ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඇත්ගාල පුස්තකාලයේ විදුලි පංකා සවිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1176 | | 11,900.00 |
| 41 | | ප්‍රිය ස්ටෝර්ස් - ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇත්ගාල නගරයේ වීදි පහන් දැමීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1177 | | 7,850.00 |
| 42 | | එන්.යූ.ජී.ඊ.එස් විමලරත්න මයා.කුරුදුවත්ත. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා ජල යෝජණා ක්‍රම වල ජලය පිරිසිදු කිරීම සඳහා ක්ලෝරීන් 50 Kg බැරලයක් මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1178 | | 12,500.00 |
| 43 | | ටී.එම් කරුණාරත්න මයා.නව ලහිරු මුද්‍රණාලය, අංක 01, දුම්රිය පොළ පාර. ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඇත්ගාල උප කාර්යාලයේ පරිහරණය සඳහා පොලිමර් මුද්‍රාවක් වෙනුවෙන් ගෙවීම. | 1179 | | 3,470.00 |
| 44 | | නෙත්මි ෂොපින් සෙන්ටර් ,කුරුදුවත්ත | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක උපකරණ වලට අයත් සබන් මිලට ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1180 | | 1,850.00 |
| 45 | | පී.කේ.ජී.ඩබ්.පී බංඩාර මයා - නාවලපිටිය පාර,ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඊ නැණ පියස පුහුණු මධ්‍යස්ථානයේ අක්‍රීය වූ පරිගණකයට නවතම උපාංග යොදා සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1181 | 25.00 | 38,975.00 |
| 46 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022.10.12 දින උඩහේන්තැන්න වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් නෙල්ලිගල බෞද්ධ මධ්‍යස්ථානය වෙත රැගෙන යාමේ වැඩසටහන සඳහා කුරුදුවත්ත තේ කම්හල ලබා දුන් ආධාර මුදලින් ලබා ගත් අත්තිකාරම පියවීම. | 1182 | | 10,000.00 |
| 47 | | ඩබ්.ජනජීව - සංවර්ධන නිලධාරී | රාජකාරී ගමන් වියදම් ගෙවීම - ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ CP -ZA 5420 අංක දරන මෝටර් ගේඩරයේ යෝග්‍යතා සහතික ලබා ගැනීම සඳහා. | 1183 | | 593.12 |
| 48 | | ඩබ්.ජනජීව - සංවර්ධන නිලධාරී | ඉංජිනේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා 2022.08.19 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1184 | | 659.70 |
| 49 | | ඩබ්.ජනජීව - සංවර්ධන නිලධාරී | ඉංජිනේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා 2022.10.03 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1185 | | 733.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 50 | | ඩබ්.ජනජීව - සංවර්ධන නිලධාරී | CP- RD- 1611ටැක්ටරයේ ආදායම් බලපත්‍රය ලබාගැනීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ආපසු ගෙවීම | 1186 | | 450.00 |
| 51 | | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් | වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව හා සභා අරමුදල -2021 ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීම. | 1187 | | 429,477.43 |
| 52 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022.10.25,26,27 දින වලදී ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යාල කටයුතු විගණනය සඳහා පැමිණි විගණන නිලධාරීන්ට සහ 2022.10.27,28 දින වල නෙක්ෆා ඕස්ට්‍රේලියා මෘදුකාංගය පිළිබඳව පුහුණු කිරීමට එම ආයතනයෙන් පැමිණි නිලධාරීන්ට සංග්‍රහ කටයුතු කිරීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 1188 | | 5,000.00 |
| 53 | | NECFA Australia ( pvt) ltd | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ස්ථාපිත කර ඇති NECFA මෘදුකාංගයට අදාළ 2022 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සේවා ගාස්තු ගෙවීම. | 1189 | 25.00 | 72,475.00 |
| 54 | 2022-10-28 | සී/ස ගඟඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය | සී/ස ගඟඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතියේ ඉන්ධන පිරවුම්හලෙන් ණය පදනම මත ලබා දී ඇති ඉන්ධන සඳහා මුදල් ගෙවීම. ( 2022.10.03 සිට 2022.10.14 දක්වා ) | 1190 | | 199,921.20 |
| 55 | | සී/ස ගඟඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය | සී/ස ගඟඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතියේ ඉන්ධන පිරවුම්හලෙන් ණය පදනම මත මෙම සභාවට ලබා ගනු ලබන ඉන්ධන සඳහා තැම්පත් මුදල රු.500000.00 දක්වා වැඩි කිරීම වෙනුවෙන් ඉතිරි මුදල් ගෙවීම. | 1191 | | 250,000.00 |
| 56 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය,බොස්වෝඩ්.වටකේදෙණිය. | 2021 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද සුහදගල නාවල පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරැඳි මුදල් ගෙවීම. | 1192 | | 14,194.95 |
| 57 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය,බොස්වෝඩ්.වටකේදෙණිය. | 2021 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද සුහදගල විමලසේන මහතාගේ නිවස අසලින් ඉහළ මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරැඳි මුදල් ගෙවීම. | 1193 | | 14,155.28 |
| 58 | | නීතිඥ ඩී.එම්.ඒ ක්‍රිෂාන්ත මංජුල මයා | මැදිකැලේ සුසාන භූමියට යන මාර්ගයේ නෛතික තත්ත්වය පැහැදිලි කිරීම වෙනුවෙන් නීතිඥ ගාස්තු ගෙවීම. | 1194 | | 2,000.00 |
| 59 | | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | LGIIP /GANGA/PS/LR/RD/02 ණය මුදලට අදාළ 2022 ඔක්තෝබර් මස ණය වාරිකය හා පොලිය ගෙවීම. | 1195 | | 20,556.93 |
| 60 | | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් - උලපනේ | වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව හා සභා අරමුදල -2021 ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1196 | 25.00 | 681,810.82 |
| 61 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කාර්යාලයීය ලිපි තැපැල් කිරීමට අවශ්‍ය මුද්දර ලබා ගැනීම | 1197 | | 10,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 62 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ආයුර්වේද වෛද්‍ය ඩබ්.අයි.එස් පතිරණ මියගේ සහ පරිසර නිලධාරී පී.පී.එස්.ජේ. කිත්සිරි මහතාගේ හිඟ වැටුප් ගෙවීම. | 1198 | | 63,967.44 |
| 63 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා ලේකම් ඩී.එම්.එල්.ඩී දසනායක මියගේ ඔක්තෝබර් මස වැටුපෙන් 2022.10.21 දිනැතිව චෙක්පත් අංක 42012 මගින් මහනුවර ක්‍රෙඩිට් පුද්ගලික සමාගම වෙත අවකරණය කර යොමු කරන ලද චෙක්පතේ වටිනාකම නැවත ගෙවීම. | 1199 | | 2,117.00 |
| 64 | 2022-10-31 | ප්‍රජා පවුර ග්‍රාම සංවර්ධන සමිතිය.තැඹිලිගල,උලපනේ | 2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද කහටගස්තැන්න රූපසේන මහතාගේ නිවස අසලින් දුම්රිය මාර්ගය දක්වා ඇති මාර්ගයේ බෝක්කුව අළුත්වැඩියා කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1200 | | 441,340.78 |
| 65 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022.10.25,26,27 දින වලදී ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යාල කටයුතු විගණනය සඳහා පැමිණි විගණන නිලධාරීන්ට සහ 2022.10.27,28 දින වල නෙක්ෆා ඕස්ට්‍රේලියා මෘදුකාංගය පිළිබඳව පුහුණු කිරීමට එම ආයතනයෙන් පැමිණි නිලධාරීන්ට සංග්‍රහ කටයුතු කිරීම සඳහා 2022.10.27 දින ලබා ගත් අත්තිකාරම් පියවීම. | 1201 | | 2,910.00 |
| 66 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ඇත්ගාල පොදු වැසිකිළිය උතුරා යාම නිසා නව වළක් කපා එය සම්බන්ධ කිරීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1202 | | 3,500.00 |
| 67 | 2022-11-01 | සංජය පල්ලගේ මයා -නෙක්ෆා ඕස්ට්‍රේලියා පුද්ගලික සමාගම. | 2022.10.27 හ 28 දිනවලදී ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සඳහා නෙක්ෆා මෘදුකාංගය පිළිබඳව පුහුණුවක් ලබා දීමට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම | 1203 | | 4,200.00 |
| 68 | | එම්.එම්.ඩී.පී බංඩාර මයා - සංවර්ධන නිලධාරී | 2022.10.25 දින කුරුදුවත්ත වෙළඳ සංකීර්ණයේ සංශෝධිත සැලැස්ම හා සංශෝධිත ඇස්තමේන්තුව භාර දීම සඳහා පල්ලෙකැලේ පලාත් පාලන සහකාර කාර්යාලය වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1204 | | 826.00 |
| 69 | | එම්.එම්.ඩී.පී බංඩාර මයා - සංවර්ධන නිලධාරී | 2022.10.27 දින පල්ලෙකැලේ කළමණාකරන පුහුණු ආයතනයේ පැවති මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත්කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1205 | | 2,160.00 |
| 70 | | පී.එච්.එන් විමලසිරි -සංවර්ධන නිලධාරී | 2022.10.14 දින පල්ලෙකැලේ කළමණාකරන පුහුණු ආයතනයේ පැවති සතුටින් සිටීමට මනෝ විද්‍යාව යන සම්මන්ත්‍රනය සඳහා යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 1206 | | 762.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 71 | | බී.එම්.සුරේනි ඉදුනිල් බාලසූරිය මිය - සංවර්ධන නිලධාරි | 2022.10.18 දින (Front Office Operation ) පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා පල්ලෙකැලේ මධ්‍යම පළාත් සභාව වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 1207 | | 1,272.00 |
| 72 | | බී.එල් වින්ධ්‍යා දුලාංජලී සිල්වා මිය - සංවර්ධන නිලධාරි | මු.රෙ.104 (4) පරීක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා 2022.10.21 දින පල්ලෙකැලේ කළමණාකරණ පුහුණු ඒකකයට යාම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1208 | | 1,372.00 |
| 73 | | ඩී.එම්.එල්.ඩී දසනායක මිය - ලේකම් ගගඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | මු.රෙ.104 (4) පරීක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගි වීමට 2022.10.21 දින පල්ලෙකැලේ කළමණාකරණ පුහුණු ඒකකයට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1209 | | 1,000.00 |
| 74 | | ඩී.එම්.එල්.ඩී දසනායක මිය - ලේකම් ගගඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | (Self Development & Self manegement ) පුහුණු වැඩසටහන සඳහා සහභාගි වීමට 2022.09.15 දින පල්ලේකැලේ කළමණාකරණ පුහුණු ඒකකයට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1210 | | 1,000.00 |
| 75 | | ඩී.එම්.එල්.ඩී දසනායක මිය - ලේකම් ගගඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | 2022.09.27 දින මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යාම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ගෙවීම. | 1211 | | 500.00 |
| 76 | | ඩබ්.ජේ.පී ගුණරත්න මයා - ආදායම් පරීක්ෂක | 2022 ඔක්තෝබර් මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 1212 | | 4,836.00 |
| 77 | | ටී.සී.ප්‍රීතිකා ද සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි | මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳව පුහුණු වැඩසටහන සඳහා 2022.10.21 දින පල්ලෙකැලේ කළමණාකරණ පුහුණු ඒකකයට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 1213 | | 1,286.00 |
| 78 | | ඩබ්.එම් මද්දුම බංඩාර මයා - තාක්ෂණ නිලධාරි | 2022 ඔක්තෝබර් මස වැටුප් ගෙවීම (කොන්ත්‍රාත්) | 1214 | 25.00 | 61,903.00 |
| 79 | | ජී.එස්.අයි.එස් පෙරේරා මයා - බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 2022 ඔක්තෝබර් මස වැටුප් ගෙවීම | 1215 | | 37,451.80 |
| 80 | | ගොඩකුඹුර කොමියුනිකේෂන් - කුරුදුවත්ත | කුරුදුවත්ත මහජන පුස්තකාලයට 2022 ඔක්තෝබර් මස පුවත්පත් මිළට ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල හිග කඩකුලී සඳහා හිලව් කිරීම. | 1216 | | 7,350.00 |
| 81 | | කේ.එම්.එම්.රිෂාඩ් මයා | පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා ලදුපත් අංක 4101 හා 4118 යටතේ ගෙවූ මුදල් 2022.10.11 දින මුදල් කමිටු තීරණ අනුව නැවත ගෙවීම. | 1217 | | 4,000.00 |
| 82 | | කේ.ආර්.දිමුතු මධුසංඛ කලංසූරිය මයා - පරිගණක උපදේශක | 2022 ඔක්තෝබර් මස ඊ නැණ පියස පරිගණක උපදේශක දීමනාව ගෙවීම. | 1218 | 25.00 | 29,975.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 83 | | ලේකම් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022.10.21 දින උලපනේ සුධර්මා පෙර පාසලෙහි කසළ කළමනාකරණය හා ඩෙංගු පාලනය පිළිබඳව පැවැත්වූ වැඩසටහන සඳහා ළමුන් වෙනුවෙන් සංග්‍රහ කටයුතු කිරීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1219 | | 4,530.00 |
| 84 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | කුරුදුවත්ත මහජන පුස්තකාලයේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම | 1220 | | 610.00 |
| 85 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | කුරුදුවත්ත ආයුර්වේද ගොඩනැගිල්ලේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම | 1221 | | 710.00 |
| 86 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | උලපනේ ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම. | 1222 | | 958.98 |
| 87 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | ඇත්ගාල ක්‍රීඩාපිටියේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම. | 1223 | | 610.00 |
| 88 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම. | 1224 | | 16,701.54 |
| 89 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම. | කුරුදුවත්ත ක්‍රීඩා පිටියේ 2022 ඔක්තෝබර් මස විදුලි බිල්පත ගෙවීම. | 1225 | | 685.00 |
| 90 | | කේ.ජී.ගයාන් නිරංජල බංඩාර මයා ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී | 2022 ඔක්තෝබර් මස ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනා ගෙවීම | 1226 | | 25,000.00 |

## 09. වෙනත්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා**

**ගරු සභාපතිතුමනි,සභාවේ පුවත්පත් වෙන්දේසි කිරීමේදී අඩු මුදලකට පත්තර මිළදී ගෙන පිටතදී වැඩි මුදලකට අළෙවි කිරීම සිදුවෙනවා.කිහිපදෙනෙක් පැමිණ රුපියල් හත්දහසකට මිළදී ගන්නා පුවත්පත් පිටතදී රුපියල් අනූදහසකට විකුණනු ලබනවා.මේ සම්බන්ධයෙන් සළකා බැලීම සුදුසු බව මගේ අදහසයි.**

**ගරු සභාපතිතුමා**

**පුවත්පත් වෙන්දේසි කිරීමෙන් තොරව විකිණීම සඳහා සභා තීරණයක් ගත හැකිද යන්න සළකා බැලීම සුදුසුයි.**

ගරු සභාපතිතුමා

**අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෑවෑ 01.20 ට අවසන් කරන ලදි.**

**සභාපති**

**ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව**

**2022.11.09 වනදින ගඟ ඉහළ කෝරලේ**

**ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ය.**